## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, 2020 අගෝස්තු

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**බෞද්ධ ශිෂ්ටාචාරය i** **කාලය පැය දෙකයි**

**උපදෙස්**

- * සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- * උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- * උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- * 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4),(5) යන පිළිතුරුවලින් නිවරදි හෝ ඉතාමත් ගැළපෙන උත්තරය තෝරාගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

1. බ්‍රාහ්මණයන් විසින් කුලීන වර්ණයන්ගේ මෙලොව මෙන් ම පරලොව අභිවෘද්ධිය උදාකරලීමට නොවරදින ඒකායන මාර්ගය ලෙස නිර්දේශ කරන ලද ශුද්ධ වූ ආගමික ක්‍රියාකාරකම වූයේ,

1. ස්වධර්ම ක්‍රියාවලියයි.
2. උපනයන ක්‍රියාවලියයි.
3. යාග කර්ම ක්‍රියාවලියයි.
4. ආශ්‍රම ධර්ම ක්‍රියාවලියයි.
5. ආපද් ධර්ම ක්‍රියාවලියයි.

2. බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අනුව ස්වාමියාගේ මරණයෙන් පසු භාර්යාව ජීවත් වන්නේ නම් ඇය වාසය කළයුත්තේ කිළිටි වස්ත්‍ර හැඳ, රසවත් ආහාරපානාදියෙන් වැළකී, කිසිදු ආභරණයක් නොපැළඳ, මිය ගිය ස්වාමියා ම පතමින් ගෘහ දාසියක ලෙසය. මෙම චාරිත්‍රය බ්‍රාහ්මණ ධර්මයන්හි දැක්වෙන්නේ,

1. සති පූජාව වශයෙනි.
2. ගෘහීය චාරිත්‍ර වශයෙනි.
3. උපනයන චාරිත්‍ර වශයෙනි.
4. පර්ධා චාරිත්‍ර වශයෙනි.
5. ශ්‍රාද්ධ පූජාව වශයෙනි.

3. බුදුරදුන් පහල වන වකවානුවේ දී භාරතීය ආගමික පරිසරය විවිධ ආගමික මතවාද වලින් ගහන වූවක් විය. මිනිසා මේ ආගමික ඉගැන්වීම් වලට ලක් ව අවුලෙන් අවුලට පත්ව සිටියහ. අහේතු අප්පච්චයවාදය එසේ පැවැති දර්ශන වාදයන්ගෙන් එකකි. එම දර්ශන වාදය ඉදිරිපත් කළ අය අතර ප්‍රමුඛයන් වන්නේ,

1. ජෛනයන් ය.
2. ආජීවකයන් ය.
3. පරිබ්‍රාජකයන් ය.
4. තාපසයන් ය.
5. ජටිලයන් ය.

4. නමින් පුන්‍යදාස වුවත් ඔහු අමුතුම ගතිපැවැතුම් හා සිතුම් පැතුම් වලින් යුතු අයෙකි. ඔහු කිසිවිටකත් දන්දීම පුණ්‍ය ක්‍රියාවක් ලෙස නොසලකයි. දෙමව්පියන්ට ගරු නොකරයි. මෙලොව පරලොව පිළිබඳ විශ්වාසයක් නොතබයි. බුද්ධ කාලීන භාරතයේ ෂට් ශාස්තෲන් අතරින් මෙබඳු දර්ශනයක් ඉදිරිපත් කරනු ලැබුවේ ?

1. පූරණ කස්සපයි.
2. සංජය බෙල්ලට්ඨිපුත්තයි.
3. නිඝන්ඨනාථපුත්තයි.
4. පකුධ කච්චායනයි.
5. අජිත කේසකම්බලියි.

5. බුදුරදුන් පහල වන විට ශ්‍රමණ චින්තනය තුළ විශාල අනුගාමිකයින් පිරිසකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළ ආගමිකයන් අතර ෂට් ශාස්තෲවරු ප්‍රමුඛ වෙති. මොවුන් විසින් විවිධ දර්ශන ඉදිරිපත් කරන ලදී. නමුත් ඔවුන් සියලු දෙනාම බැහැර කළ ආගමික මතයක් වන්නේ,

1. සියලු ම මිනිස්සු මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.
2. සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.
3. කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.
4. සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.
5. සමාජයේ යහ පැවැත්මට කුල භේදය අත්‍යවශ්‍ය බවයි.

6. වත්ස රාජ්‍යය සොළොස් මහා ජනපද අතරින් මහා රාජ්‍යය ගණයට අයත් වූවකි. මෙම රාජ්‍යය තුළ ද බුදු දහම ව්‍යාප්තව පැවැති බවට තොරතුරු ශාසන ඉතිහාසය අධ්‍යයනය කිරීම තුළින් වටහාගත හැකි ය. එයට එක් සාධකයක් වන්නේ බුදුරදුන් මෙම රාජ්‍යය තුළ වස්විසූ අවස්ථා වාර්තා වී තිබීමයි. බුදුරදුන් මෙහි වස්විසූ වකවානුවක ඇතිවූ විශේෂ සිදුවීමක් වන්නේ,

1. ධර්මධර විනයධර භික්ෂු ගැටුම ඇතිවීමයි.
2. අනේපිඬු සිටුතුමා ජේතවනාරාමය පූජාකිරීමයි.
3. බුදුරදුන් විසින් අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කිරීමයි.
4. ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදුවීමයි.
5. බුදුරදුන් විසින් වස්විසීම නිර්දේශ කිරීමයි.

7. බුද්ධ කාලීන බොහෝ රාජ්‍ය පාලකයින් බුදුරදුන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන යමින් ශාසන උන්නතිය සඳහා මහගු මෙහෙවරක් ඉටුකර ඇත. ඇතැම් රාජ්‍ය පාලකයින් මිත්‍රත්වය ඉක්මවා ගිය ඥාතිත්වයක් පවා ගොඩනගා ගැනීමට කැමැත්තක් දැක්වූහ. එසේ ඥාතිත්වයක් ගොඩනගා ගැනීමට යොමු වූ පාලකයෙක් ලෙස සැලකිය හැක්කේ,

1. මගධාධිපති බිම්බිසාර රජතුමා ය.
2. කෝසලයේ පසේනදි කොසොල් රජතුමා ය.
3. අවන්තියේ පාලකයා වූ චණ්ඩපජ්ජෝත රජතුමා ය.
4. වත්සයේ පාලකයා වූ උදේනි රජතුමා ය.
5. ගන්ධාරයේ පාලකයා වූ පුක්කුසාති රජතුමා ය.

8. බුදුරදුන් තම ධර්ම දේශනාවන්හි දී හා සාකච්ඡාවන්හි දී එකල පැවැති ජීවන වෘත්තීන් ද නිදසුන් ලෙස යොදාගත් අවස්ථාවන් ත්‍රිපිටකාගත මූලාශ්‍රය අධ්‍යයනයේ දී හෙළිවේ. එහි දී වැඩි වශයෙන් ම ව්‍යවහාරයට පත් ජීවන වෘත්තීන් නම්,

1. කෘෂිකර්මාන්තය හා පශු පාලනයයි.
2. කෘෂිකර්මාන්තය හා රාජ්‍ය සේවයයි.
3. කෘෂිකර්මාන්තය හා පේෂ කර්මාන්තයයි.
4. කෘෂිකර්මාන්තය හා වෙළෙඳාමයි.
5. කෘෂිකර්මාන්තය හා වෙනත් ශිල්ප කර්මාන්තයයි.

9. ''ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති'' යන ගාථා පාඨයෙන් ප්‍රකට වන බුද්ධ චරිතයේ විශිෂ්ට ගුණය හැඳින්වෙන්නේ,

1. අරහං ගුණය ලෙස ය.
2. ලෝකවිදූ ගුණය ලෙස ය.
3. තාදීගුණය ලෙස ය.
4. යථාවාදී තථාකාරී ගුණය ලෙස ය.
5. පුරිස ධම්ම සාරථී ගුණය ලෙස ය.

10. ''ලෝකයේ ප්‍රසිද්ධ ආගම්වලින් මා බුදුදහමට විශේෂයෙන් මුල් බුදු දහමට කැමැති වන්නේ එය කිසිවකු පීඩාවට පත් නොකරන බැවිනි.'' බුදුරදුන් පිළිබඳ ව මෙසේ නූතනයෙ හි ඇගයීමට ලක්කරනු ලැබුවේ .

1. මහාචාර්ය සෝන්ඩස් විසිනි.
2. එඩ්වින් ආර්නෝල්ඩ් විසිනි.
3. බර්ට්‍රන් රසල් විසිනි.
4. මහාචාර්ය මැක්ස්මුලර් විසිනි.
5. ආචාර්ය සර්ව පල්ලි රාධක්‍රිෂ්ණන් විසිනි.

11. සිද්ධාර්ථ මහබෝසතාණන් වහන්සේ සම්මා සම්බුද්ධතත්වයට පත්වීමේ දී ලැබූ සර්වඥතා ඥානය සමග අෂ්ට විද්‍යා ඥාන උපදවා ගැනීමට සමත් වූ බව බුද්ධ චරිතයේ දැක්වේ. එම අෂ්ට විද්‍යා ඥානයන්ට අයත් දිබ්බ චක්ඛු ඥානය නම්,

1. සත්වයින්ගේ චුතිය හා උත්පත්තිය දැනගැනීමේ ඥානයයි.
2. දෙවියන්ගේ සිත්වල ඇති දේ දැනගැනීමේ ඥානයයි.
3. ලෝකයේ යථාර්ථය දැනගැනීමේ ඥානයයි.
4. මිනිසුන්ගේ සිත්වල ඇති දේ දැනගැනීමේ ඥානයයි.
5. පෙර ආත්ම පිළිබඳ දැනගැනීමේ ඥානයයි.

12. බුදුරජාණන් වහන්සේ ජීවමාන අවධියේ දී රූපාවචර ධ්‍යාන හතරම ලබාගත් අනාගාමී උපාසකවරයෙක් ලෙස ප්‍රකට වූයේ,

1. අනේපිඬු සිටුතුමන් ය.
2. චිත්ත ගහපති තුමන් ය.
3. ජීවක වෙදැදුරුතුමන් ය.
4. මහානාම උපාසකතුමන් ය.
5. නකුල පිතු උපාසකතුමන් ය.

13. පුද්ගල ස්වාමිත්වයට හා ස්වාධීනත්‍යවයට හානි පමුණුවන ඊශ්වර නිර්මාණවාදය, පුබ්බේකත හේතුවාදය හා නියතිවාදය බැහැර කරන බුදුසමය ඒ සඳහා ඉදිරිපත්කරන ලද ප්‍රධානත ම ඉගැන්වීම වන්නේ,

1. කර්මවාදයයි.
2. අනාත්මවාදයයි.
3. දෛවවාදයයි.
4. හේතුඵලවාදයයි.
5. ශාස්වතවාදයයි.

14. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයට අනුව මිනිස් සමාජය තුළ කිසියම් කුල ක්‍රමයක් ඇතිවීමට හේතු වී ඇත්තේ ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරකම් හා අවශ්‍යතා සැලකිල්ලට ගැනීමෙනි. එහි සඳහන් ආකාරයට වර්ණ බිහි වූ අනුපිළිවෙල වන්නේ,

1. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය, ශුද්‍ර වශයෙනි.
2. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍යය, ශුද්‍ර වශයෙනි.
3. බ්‍රාහ්මණ, වෛශ්‍යය, , ක්ෂත්‍රිය, ශුද්‍ර වශයෙනි.
4. බ්‍රාහ්මණ, වෛශ්‍යය, ශුද්‍ර, ක්ෂත්‍රිය වශයෙනි.
5. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ශුද්‍ර, වෛශ්‍යය, වශයෙනි.

15. මිනිසා මෙන්ම තිරිසන්ගත සත්වයෝ ද ජීව ලෝකයට අයත් වෙති. බුදු දහමට අනුව සියළු ජීවීන්ට මෙත් වැඩිය යුතුය. සෙත් පැතිය යුතුය. කිසියම් රටක පාලකයා යනු මේ සියලු ජීවීන්ගේ භාරකරුවා ය. එබැවින් පාලකයාගේ මූලික අරමුණ විය යුත්තේ මිනිසාගේ මෙන්ම තිරිසන්ගත සතුන්ගේ ද ජීවිත සුරක්ෂිතතාව ඇතිකිරීමයි. මේ කාරණයට වඩාත් සමීප බෞද්ධ දේශපාලන ඉගැන්වීමක් ඉදිරිපත් වන්නේ,

1. දස රාජ ධර්ම තුළ ය.
2. සප්ත අපරිහානීය ධර්ම තුළ ය.
3. සතර අගති විරතිය තුළ ය.
4. සතර සංග්‍රහ වස්තු තුළ ය.
5. දස සක්විතිවත් තුළ ය.

16. පුද්ගලයාගේ මෙන්ම සමාජයේ ද සුරක්ෂිතතාව උදාකරලීමට ඉවහල් වන ආචාර ධර්මයකි. එය

1. ළිං පොකුණු තැනීමයි.
2. ආරාම ඉදිකිරීමයි.
3. පන්සිල් ආරක්ෂා කිරීමයි.
4. සිව්සඟරාවතින් සංග්‍රහ කිරීමයි.
5. මංමාවත් සකස් කිරීමයි.

17. සිරිමත් අළුයම නැගිට ගෙවල් මිදුල් ඇමඳ, තම පිරිසිදුවීම් කටයුතුවල නිරත ව, නිවසේ බුද්ධ ප්‍රතිමාව අභියස මල් පහන් පුදා දෙමව්පියන් නැමැද උදෑසන ම පාසල් යන ශිෂ්‍යයෙකි. මොහුගේ මෙම චර්යා රටාවන් දස පුණ්‍ය ක්‍රියාවල කුමන ක්‍රියාවන්ට ඇතුළත් වේද?

1. වෙය්‍යාවච්චයට හා අපචායනයට ඇතුළත් වේ.
2. පත්තිදානයට හා අපචායනයට ඇතුළත් වේ.
3. දිට්ඨිජුකම්මයට හා අපචායනයට ඇතුළත් වේ.
4. වෙය්‍යාවච්චයට හා පත්තානුමෝදනාවට ඇතුළත් වේ.
5. පත්තිදානයට හා පත්තානුමෝදනාවට ඇතුළත් වේ.

18. පහත සඳහන් ශික්ෂාපද අතරින් උපෝසථ අෂ්ටාංග සීලයට අයත් වන්නේ,

1. පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
2. කාමේ සු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
3. නච්චගීතවාදිත විසූක දස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.
5. මාලාගන්ධ විලේපන ධාරනමණ්ඩන විභූසණට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන්නයි.

19. නිරාමිස සෞන්දර්ය රසාස්වාදය බුදුසමයට අනුව අනුචිත වූවක් නොවේ. බුදුරජාණන් වහන්සේ මෙන් ම විරාගී යතිවරයන් වහන්සේලාද නිරාමිසව සෞන්දර්ය රසාස්වාදය කළ අවස්ථා සූත්‍රපිටකය තුළින් දැකගැනීමට පුළුවන. එසේ වුව ද බුදු දහම තුළ සෞන්දර්ය රසාස්වාදයේ මූලික ආකල්පය වී ඇත්තේ,

1. සාමිස සැප ලඟාකර ගැනීමේ ආකල්පයයි.
2. අනුත්සුක හා අනුපාදාන ආකල්පය යි.
3. ඉන්ද්‍රය පිනවීමේ ආකල්පය යි.
4. ප්‍රසාදය වැඩිදියුණු කිරීමේ ආකල්පය යි.
5. සුඛාස්වාදය විඳගැනීමේ ආකල්පය යි.

20. ධන පරිහරණයේදී නොකා නොබී මිය යන අජද්ධුමාරික ක්‍රමයත්, දිඹුල් ගසේ අතු සොලවා දිඹුල් කඩා කන්නෙකු මෙන් ක්‍රියා කරන උදුම්බර ඛාදික ක්‍රමයත් බුදුදහමින් ප්‍රතික්ෂප කරයි. ඒ වෙනුවට ව්‍යග්ඝපජ්ජ සූත්‍රය තුළින් නිර්දේශිත ක්‍රියාවලිය වන්නේ,

1. ආරක්ඛ සම්පදාව යි.
2. කල්‍යාණමිත්තතාව යි.
3. සමජීවිකතාව යි.
4. උට්ඨානසම්පදාව යි.
5. පඤ්ඤා සම්පදාව යි.

21. පොදු භාණ්ඩ විනාශයට යා නොදී සුරක්ෂිත ව තබාගැනීමටත් තෘෂ්ණාවෙන් තොර ව ප්‍රවේශමෙන් පරිහරණය කිරීමටත් අදාල ඉගැන්වීම් විනය පිටකයේ මහාවග්ග පාළියේ දැක්වේ. එපමණක් නොව ඒ සඳහා ක්‍රියාකිරීමට භික්ෂු සමාජය තුළ නිළධාරි මණ්ඩලයක් ද පත් කර ඇත. එහි යාගුභාජක ලෙස නම්කර ඇත්තේ,

1. ආහාර බෙදන්නා ය.
2. අසුන් පනවන්නාය.
3. චීවර බෙදන්නා ය.
4. සෙනසුන් පනවන්නා ය.
5. කැඳ බෙදන්නා ය.

22. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අණවජ්ජ සුඛ යන සිව් වැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහම පෙන්වා දෙයි. මේ අතරින් භෝග සුඛය නමින් හැඳින්වෙන්නේ,

1. ධාර්මිකව උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
2. ධාර්මිකව උපයාගත් සම්පත් තම දූ පුතුන්ට බෙදා දී ලබන සතුටයි.
3. ධාර්මිකව උපයාගත් සම්පත් තමන් දානා දී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.
4. ණය නොවී උපයාගත් සම්පත් තමන් සතුව ඇතැයි ලබන සතුටයි.
5. ධාර්මිකව උපයාගත් සම්පත් අර්ථවත් ව වැය කරමින් මැනවින් පරිභෝග කරමින් ලබන සතුටයි.

23. යමෙක් යහපත් සිතින් කරන කියන දේ සඳහා ලැබෙන සැපවිපාක තමා පසුපස සෙවනැල්ල මෙන් පැමිණෙන බව දැක්වෙන ධම්ම පද ගාථාවේ නිදාන කතාව වන්නේ,

1. චක්ඛුපාල කතාවස්තුව යි.
2. මඝමානවක කතාවස්තුව යි.
3. මට්ටකුණ්ඩලී කතාවස්තුව යි.
4. කුම්භගෝෂක කතාවස්තුව යි.
5. ධම්මික කතාවස්තුව යි.

24. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන තුදුස් ලාමක ධර්මයන්ට භෝග විනාශ මුඛ හය ද ඇතුලත් වේ. එම එක් එක් භෝග විනාශ මුඛයන්ගෙන් සිදුවන හානි ද හය බැගින් එහි දැක්වේ. එහි සඳහන් " සන්දිට්ඨිකා ධනඤ්ජානි " ( බලාගෙන සිටියදීම ධනය විනාස වේ ) යනුවෙන් සඳහන් කරුණ භෝග විනාස මුඛ දෙකකම දැකිය හැකිය. එම භෝග විනාශ මුඛයන් වන්නේ,

1. රහමෙර පානය හා දූ කෙළිය යි.
2. දූ කෙළිය හා පාපමිත්‍ර සේවනය යි.
3. පාපමිත්‍ර සේවනය හා නොකල්හි වීදි සංචාරය යි.
4. නොකල්හි වීදි සංචාරය හා අලසකම යි.
5 අලසකම හා සමජ්ජාපිචරණය යි.

25. සූත්‍ර පිටකයේ දැක්වෙන සියළු සූත්‍ර දේශනාවන් මිනිසුන් සඳහා පමණක් ම දේශනා කළ ඒවා නොවේ. ඒවායින් ඇතැම් දේශනා දෙවියන් යක්‍ෂයින් වැනි මිනිසුන් නොවන අයට ද දේශනා කර ඇත. ඒ අනුව එක්තරා දෙවියෙක් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ ඇසූ ප්‍රශ්න දොළහකට පිළිතුරු වශයෙන් දේශනාකළ සූත්‍රයක් වන්නේ,

1. පරාභව සූත්‍රය යි.
2. මංගල සූත්‍රය යි.
3. සිගාලෝවාද සූත්‍රය යි.
4. ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි.
5. කරණීය මෙත්ත සූත්‍රය යි.

26. බුදුරජාණන් වහන්සේ ධර්මදූත පිරිස අමතා " දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස මුල මැද අග යහපත් වූ පාරිශුද්ධ වූ ධර්මය දේශනා කරන්නයැයි ද එක මග දෙදෙනෙක් නොයන්න " යනුවෙන් අවවාද කළහ. මෙම අවවාදය තුළින් බලාපොරොත්තු වී ඇත්තේ,

1. ශ්‍රාවක පිරිසේ ආරක්‍ෂාව යි.
2. ශ්‍රාවකයින් හුදකලා ජීවිතයට හුරු කිරීම යි.
3. ශ්‍රාවක පිරිස අතර මතවාද ගැටුම් ඇතිවීම වැළැක්වීම යි.
4. වැඩිපිරිසකට ඉක්මනින් දහම් පණිවිඩය ලබා දීම යි.
5 භික්ෂූන් සංචාරක ජීවිතයට හුරු කිරීමයි යි.

27. තමන් වහන්සේගේ උපන් භූමිය වූ දෝණවත්ථු ප්‍රදේශයට වැඩම කොට තම ඥාතිවර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන්ගත කිරීමට කටයුතු කළ මහරහතන් වහන්සේ වූයේ,

1. කොණ්ඩඤ්ඤ මහරහතතන් වහන්සේ ය.
2. අස්සජි මහරහතතන් වහන්සේ ය.
3. සැරියුත් මහරහතතන් වහන්සේ ය.
4. මුගලන් මහරහතතන් වහන්සේ ය.
5 සුනාපරන්තවාසී පුන්න මහරහතතන් වහන්සේ ය.

28. ධර්ම සංගායනාවන්හිදී මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ, සංගායනාව පැවැත් වූ ස්ථානය, අනුග්‍රාහකත්වය දැක්වූ මහරජතුමා ආදී කරුණු ඉතාවැදගත්ය. ඒ අනුව පහත දැක්වෙන වරණ අතරින් එක් වරණයක් තෙවන ධර්ම සංගායනාව සඳහා අදාලවේ. එම වරණය තෝරන්න.

1. සබ්බකාමී මහරහතන් වහන්සේ, විශාලාමහනුවර වාළුකාරාමය, කාලාශෝක රජතුමා ය.
2. සබ්බකාමී මහරහතන් වහන්සේ, විශාලාමහනුවර අශෝකාරාමය, කාලාශෝක රජතුමා ය.
3. මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ, රජගහනුවර සප්තපර්ණී ගුහාව, අශෝක රජතුමා ය.
4. මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ, පැළලුප්නුවර අශෝකාරාමය, අශෝක රජතුමා ය.
5. මොග්ගලීපුත්ත මහරහතන් වහන්සේ, පැළලුප්නුවර අශෝකාරාමය, කාලාශෝක රජතුමා ය.

29. බුද්ධ ශාසනය තුළ ඇතිව තිබූ විවිධ විෂමතා දැනගත් කණිෂ්ක රජු කුණ්ඩලවන විහාරයේදී සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා අනුග්‍රහය දැක්වී ය. එම සංගායනාවේ ප්‍රධානත්වය ගනු ලැබුවේ,

1. තාරානාථ තෙරුන් වහන්සේ ය.
2. උපගුප්ත තෙරුන් වහන්සේ ය.
3. පාර්ශව තෙරුන් වහන්සේ ය.
4. වසුමිත්‍ර තෙරුන් වහන්සේ ය.

5. නාගර්ජුන තෙරුන් වහන්සේ ය.

30. හියුං සියැන් භ්‍රමණ වෘත්තාන්තයේ භාරතයේ පැවැති ඉපැරණි විශ්ව විද්‍යාලයක් සම්බන්ධව මෙබඳු සටහනක් දක්නට ලැබේ. "සියක් ලක්‍ෂයකට වඩා ධනය ඇති සිටු පවුල් සිය ගනනක් මෙහි වසත්, පිටරටවලින් ගෙනෙන දුර්ලබ අගනා ද්‍රව්‍යයෝ මෙහි රාශි වශයෙන් දක්නට ලැබෙත්. භික්ෂූන් 6000 ක් පමණ වසන සංඝාරාම සියයක් පමණ ඇත්තේය. ......... " මේ ප්‍රකාශය අදාල වන්නේ,

1. වික්‍රමශිලා විශ්වවිද්‍යාලය සම්බන්ධවයි.
2. නාලන්දා විශ්වවිද්‍යාලය සම්බන්ධවයි.
3. සෝමපුර විශ්වවිද්‍යාලය සම්බන්ධවයි.
4. තක්ෂිලා විශ්වවිද්‍යාලය සම්බන්ධවයි.
5 වලභි විශ්වවිද්‍යාලය සම්බන්ධවයි.

31. බෞද්ධ අධ්‍යාපනය ලබාදුන් භාරතයේ පැවැති ඉපැරණි අධ්‍යාපන ආයතනයක් ලෙස නාලන්දා විශ්ව විද්‍යාලය සැලකේ. මෙහි පැවැති අධ්‍යාපන ක්‍රියාවලිය හා පරිපාලන ක්‍රියාවලිය ඉතාමත් සැළසුම් සහගත ව සිදුවූවක් බව ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් හෙළිවේ. මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුලත් වරණය වන්නේ,

1. ද්විතීක අධ්‍යාපනය ලැබීමට ඇතුලත් සිසුන් අඛන්ඩව වසර පහළොවක් මෙහි අධ්‍යාපනය ලැබිය යුතු විය.
2. ඉගැන්වීමේ ක්‍රම ශිල්ප වශයෙන් දේශන, සාකච්ඡා හා විවාද යන ක්‍රම භාවිතා විය.
3. පාලි හා සංස්කෘත භාෂාවන් සෑම ශිෂ්‍යයෙක් ම අනිවාර්යෙන් ම හැදෑරිය යුතු විය.
4. පස්චාත් උපාධි පිරිනැමුනේ මෙම විශ්ව විද්‍යාලයේම අධ්‍යාපනය හැදෑරූ ශිෂ්‍යයන්ට පමණි.
5. නේවාසික පහසුකම් සැපයීම, සේවකයින් හා ගම්වර පාලනයට වෙනම නිළධාරීන් පිරිසක් පත්කර තිබුණි.

32. මහින්දාගමණයට පෙරාතුව මෙරට පැවැති ඇදහිලි අතර දේව ඇදහිල්ලද ප්‍රබල විය. එකල දේව ඇදහිල්ල නිර්මාණය වූයේ මිනිසාගේ යම් යම් ලෞකික අවශ්‍යතා පෙරදැරි කරගෙනය. ඒ අනුව දඩයක්කරුවාගේ අධිපති දේවතාවා වූයේ,

1. උපුල්වන් දෙවියන්ය.
2. කම්මාර දෙවියන්ය.
3. ව්‍යාධ දෙවියන්ය.
4. වෛශ්‍රවන දෙවියන්ය.
5. පුරදේව දෙවියන්ය.

33. ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ආගමික ඇදහිලි හා විශ්වාස කෙරෙහි රාජ්‍ය අනුග්‍රහයද නොමදව ලැබී ඇති බව ඓතිහාසික තොරතුරුවලින් මනාව පැහැදිළිවේ. ඇතැම් පාලකයන්ගේ රාජ්‍ය කාලය තුල එම අනුග්‍රහය ප්‍රභලව සිදු වූ බවද දැකිය හැකිය. එකළ පැවැති ඇදහිලි හා විශ්වාසවලට ප්‍රභල අනුග්‍රහයක් ලබා දුන් පාලකයකු වන්නේ,

1. විජය රජතුමා ය.
2. පණ්ඩුකාභය රජතුමා ය.
3. මුඨශිව රජතුමා ය.
4. පණ්ඩුවාසදේව රජතුමා ය.
5 දේවානම්පියතිස්ස රජතුමා ය.

34. බුදු දහම ලක්දිව ස්ථාපිතවීමත් සමග බෞද්ධ භික්ෂූන් වහන්සේගේ රාජ්‍ය මැදිහත්වීම පාලනය ජනතාවාදී එකක් බවට පත්වීම කෙරෙහි ප්‍රභල සාධකයක් විය. විශේෂයෙන් එහිදී භික්ෂූන් වහන්සේ රාජ්‍ය උපදේශකත්වයට පත්වීම වඩාත් වැදගත්ය. ලක්දිව සෑම බෞද්ධ පාලකයෙකුට පාහේ උපදෙස් ලබා දුන් සමීප භික්ෂූන් වහන්සේ නමක් වැඩසිටියහ. ඒ අනුව වළගම්බා මහරජතුමන්ට අනුශාසකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේ වූයේ,
1 කුපික්කල තිස්ස හිමියන්ය.
2. කාලබුද්ධරක්ඛිත හිමියන්ය.
3. කොහොන්තිස්ස හිමියන්ය.
4. ගෝධගත්තතිස්ස හිමියන්ය.
5 සංඝමිත්‍ර හිමියන්ය.

35. දුටුගැමුණු රජු භික්ෂූන් වහන්සේ කෙරෙහි අධික ප්‍රසාදයෙන් හා ගෞරවයෙන් ක්‍රියාකළ බෞද්ධ නරපතියෙකි. ඒ බව වඩාත් හොඳින් සනාථ කරන ඔහුගේ ක්‍රියාකාරකමක් වන්නේ,
1 භික්ෂූන් වහන්සේලාට අටසැට ලෙන් ඉදිකර පූජා කිරීම යි.
2. යුද්ධයට යාමේ දී භික්ෂූන් වහන්සේලා පෙරටුව ගමන් කිරීම යි.
3. සම්බුදු සසුන ආරක්ෂාකිරීම සඳහා එළාරනම් වූ ද්‍රවිඩ පාලකයා යුධමය වශයෙන් පරාජය කිරීම යි.

4. කඨින පූජාව, අරියවංශ පූජාව, වෙසක් උත්සවය ආදිය පැවැත්වීමෙන් සංස්කෘතිය පෝෂණය කිරීම යි.
5. රජතුමා ආහාරපාන ගැනීමට ප්‍රථම දෛණිකව ආහාරපාන වලින් කොටසක් භික්ෂූන් වහන්සේලාට පූජාකිරීම යි.

36. අනුරාධපුරයේ පැවැති මහා විහාරය දෙස් විදෙස් සුපතළ අධ්‍යාපන ආයතනයක් මෙන්ම ථෙරවාද බුදුදහමේ කේන්ද්‍රස්ථානය ද විය. මෙහි වැඩවිසූ භික්ෂූන් වහන්සේලා එම යුග මෙහෙවර ඉටුකරලීම උදෙසා විවිධ ක්‍රියාමාර්ගවලට යොමු විය. ඒ අනුව උන්වහන්සේලා ගත් එම ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් වනුයේ,

1. සංරක්ෂණසිලී ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීම යි.
2. ආගමික පුදපූජා සඳහා ප්‍රමුකත්වයක් ලබා දීම යි.
3. පාලකයන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන යෑම යි.
4. පෞද්ගලිකත්වයට යොමුව කටයුතු කිරීම යි.
5 ප්‍රතිසංස්කරණවාදී මතයක පිහිටා කටයුතු කිරීම යි.

37. වළගම්බා රජු විසින් ආරම්භකළ අභයගිරිය මෙරට ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරන ආගමික මෙන්ම අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ද විය. මහා විහාරයට අභියෝගාත්මකව ජනතා ආකර්ශනය තමන් වෙත ලබා ගැනීම උදෙසා ක්‍රියාකිරීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි. අභයගිරියේ වැඩවාසය කළ භික්ෂූන් වහන්සේලා ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ගයන්ට යොමු වූහ. එසේ යොමු වූ එක් ක්‍රියාමාර්ගයක් වූයේ,

1. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට යොමුවීම යි.
2. අටුවා ග්‍රන්ථ සම්පාදනය කිරීමට යොමුවීම යි.
3. ත්‍රිපිටකය මුඛ පරම්පරාගතව පවත්වාගෙන යාමට යොමුවීම යි.
4. ථෙරවාදී බුදු දහමට පටහැනි මතවාද බැහැර කිරීමට යොමුවීම යි.
5. ජනප්‍රිය පුදපූජා උත්සව සංවිධානය කිරීමට යොමුවීම යි.

38. ශ්‍රී ලංකාව ආගන්තුක සත්කාරය කෙරෙහි අතීතයේ සිට සම්භාවනාවට ලක් වූ රාජ්‍යයකි. රොබට් නොක්ස් වැන්නවුන්ගේ ප්‍රකාශයන් එයට එක් නිදසුනක් පමණි. මෙයට ප්‍රදානතම හේතුව ලක්දිව බුදු දහමින් පෝෂිත රටක් වීමයි. පත්තකම්ම සූත්‍රයේ දක්වෙන පඤ්ච බලිවලින් එකක් මේ ලක්ෂණය හා බැඳී පවතී. එය කුමන නමකින් හැඳින්වේද?

1. පුබ්බපේත බලි නමිනි.
2. ඥාතිබලි නමිනි.
3. රාජ බලි නමිනි.
4. අතිථි බලි නමිනි.
5. දේවතා බලි නමිනි.

39. බුදු දහම මෙරට ස්ථාපිතවීමත් සමග එයට අනුරූපීව අපේ සංස්කෘතිය ගොඩනැගුණි. එම සංස්කෘතිය ඔපවත් කරන විශේෂාංග අතර දානාදී පිංකම් සඳහා ප්‍රමුඛ තැනක් හිමිවේ. දානාදී පිංකම් ද විවිධාකාර වේ. ඒ අතරින් අනුග්‍රහ බුද්ධියෙන් දෙනු ලබන දානයක් වන්නේ,

1. භික්ෂූන් වහන්සේලා උදෙසා දන් පිළිගැන්වීම යි.
2. ළමා නිවාසයකට පොත්පත් ලබාදීම යි.
3. මරණයට පත්වූ ගවයෙකු නිදහස් කිරීම යි.
4. භික්ෂූන් වහන්සේලාට දහම් පොත් පත් පූජා කිරීම යි.
5. බුදුරජාණන් වහන්සේ උදෙසා ගිලන්පස පූජාකිරීම යි.

40. නිර්මල ථෙරවාදී බුදු දහම ක්‍රියාත්මක රටක් වශයෙන් ගැනෙන ථායිලන්තයේ භික්ෂූන් වහන්සේට සමාජය තුළ සුවිශේෂී තැනක් හිමිව ඇත. එරට භික්ෂු සමාජයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබන්නේ ද සංඝරාජයන් වහන්සේ ය. උන්වහන්සේට එරට රජතුමාට හා සමාන බලයක් හිමි වී ඇත. එබඳු බලයක් සහිත සංඝරාජයාණන් වහන්සේ පත්කරනු ලබන්නේ,

1 එරට ජනතාව විසිනි.
2. එරට භික්ෂූන් වහන්සේලා විසිනි.
3. එරට සංඝ මන්ත්‍රී මණ්ඩලය විසිනි.
4. එරට රජතුමා විසිනි.
5. එරට උත්තරීතර සංඝ සභාව විසිනි.

41. බුරුමයේ සිට ත්‍රිපිටක දහම හැදෑරීමට මෙරටට පැමිණි ඡප්පට හිමියන් දස වසරකට අධික කාලයක් මහා විහාරයේ රැඳීසිටිමින් ත්‍රිපිටක දහම මැනවින් හදාරා නැවත බුරුමයට වැඩම කළ බව වාර්තා වේ. එසේ වැඩම කිරීමෙන් පසු ඡප්පට හිමි බිහිකළ නිකාය වන්නේ,
1. මරම්ම නිකායයි. 2. සියම් නිකායයි.
3. ධම්ම යුත්තික නිකායයි. 4. රාමඤ්ඤ නිකායයි.
5. සීහල සංඝ නිකායයි.

42. ජපානයේ බෞද්ධාගමික ඉතිහාසය විකාශය වන්නේ එරට පැවැති රාජධානි යුග පදනම් කරගෙනය. ඒ අනුව ජපානයට සෙන් බුදු දහම ලැබෙන්නේ කිනම් රාජධානි යුගයේදී ද?
1. නාරා යුගයේදී ය. 2. හෙයියන් යුගයේදී ය.
3. මෙයිජි යුගයේදී ය. 4. ෂෝතෝකු තයිෂි යුගයේදී ය.
5 කමකුරා යුගයේදී ය.

43. චීනය මහායාන බුදුසමය ක්‍රියත්මක රාජ්‍යයකි. එහි කළක් භික්ෂු සමාජය මෙන්ම භික්ෂුණී සමාජයද හොඳින් ක්‍රියාත්මක විය. එරට භික්ෂුණී සමාජය ක්‍රියාත්මක කරලීමෙහි මූලිකත්වය ගත් තෙරණින් වහන්සේ චීනයට වැඩම කරනු ලැබුවේ,
1. බුරුමයෙනි. 2. කොරියාවෙනි.
3. ශ්‍රී ලංකාවෙනි. 4. ජපානයෙනි.
5. ථායිලන්තයෙනි.

44. ක්‍රි. පූ. පළමු සියවසේ හෝ ක්‍රි. ව. පලමු සියවසේ දී පමණ බුදුරදුන් මානව රූපීව නිර්මාණය කිරීමට කලාකරුවන් පෙළඹී ඇතිබව උගතුන්ගේ පිලිගැනීමයි. ගන්ධාර හා මථුරා සම්ප්‍රදායන් මේ සඳහා උනන්දු වී ඇත. මථුරා සම්ප්‍රදායේ බුද්ධ ප්‍රතිමාවලට සාපේක්ෂව ගන්ධාර ප්‍රථිමා වල දක්නට ලැබෙන සුවිශේෂී වෙනස් කමක් වන්නේ,
1. තොල් මහත්ව තිබීමයි. 2. දෙනෙත් අඩවන්ව තිබීමයි.
3. පිම්බුණු කම්මුල් සහිතවීමයි. 4. හිසකේ කැරලි ගැසී තිබීමයි.
5. විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුරකින් යුක්ත වීමයි.

45. ශ්‍රී ලංකාවේ පිහිටි හිටි පිළිම වල බහුලව දක්නට ලැබෙන මුද්‍රා ලක්ෂණය වන්නේ,
1. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රායි. 2. ධර්ම චක්‍ර මුද්‍රාවයි.
3. අභය මුද්‍රාවයි. 4. වරද මුද්‍රාවයි.
5. විතර්ක මුද්‍රාවයි.

46. දෙවන පැතිස් රජුගේ සොහොයුරු උත්තිය රජු විසින් මිහිදු හිමියන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ඉදිකළ චෛත්‍යය වන්නේ,
1. අම්භස්ථල චෛත්‍යයි. 2. ලංකාරාම චෛත්‍යයි.
3. සේල චෛත්‍යයි. 4. කණ්ඨක චෛත්‍යයි.
5. මිරිසවැටි චෛත්‍යයි.

47. ත්‍රිවිධ චෛත්‍යය අතර උද්දේශික චෛතයට ගැනෙන බුදු පිළිමයෙහි ආරක්ෂාව සඳහා ගෘහයන් ඉදිකිරීමට ගෘහ නිර්මාණ ශිල්පීන් යොමු විය. මුලින්ම ප්‍රතිමා සඳහා ඉදිවූ ගෘහ විශේෂය සඳහා බුදුරදුන් ජීවමානකාලයේ වැඩ සිටි ගන්ධ කුටියේ සැලැස්ම ආභාශයට ගැනුණි. ඒ අනුව ලංකාවේ ගන්ධ කුටි සම්ප්‍රදායට අයත් පටිමා ඝරයක් වන්නේ,
1. ථූපාරාම පිළිමගෙයයි. 2. කිරිබත් වෙහෙර පිළිම ගෙයයි.
3. රත්න ප්‍රාසාදය අභියස ඇති පිළිම ගෙයයි. 4. තිවංක පිළිම ගෙයයි.
5. පන්කුලිය පිළිමගෙයයි.

48. ලක්දිව දක්නට ලැබෙන කලා නිර්මාණ අතර සඳකඩපහන අග්‍රගන්‍ය නිර්මාණයකි. එය විවිධාකාර හැඩතලයන් ගෙන් යුක්ත විය. ඒ අතර ත්‍රිකෝණාකාර හැඩය ඇති සඳකඩපහන බහුලව දක්නට ලැබෙන්නේ
1. පොලොන්නරු යුගයේදී ය. 2. අනුරාධපුර යුගයේදී ය.

3. මහනුවර යුගයේදී ය.
4. යාපහුව යුගයේදී ය.
5. කුරුණෑගල යුගයේදී ය.

49. බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ මුල්කරගෙන සිංහල සාහිත්‍ය ග්‍රන්ථ රැසක් බිහිවිය. ඒ අතර අරහං බුදුගුණය මුල්කරගෙන බිහිවූ පැරණි සිංහල බණකතා සාහිත්‍ය ග්‍රන්ථය නම්,
1. බුත්සරණයි.
2. අමාවතුරයි.
3. සද්ධර්ම රත්නාවලියයි.
4. පූජාවලියයි.
5. බුදුගුණාලංකාරයයි.

50. බුද්ධ චරිතය, බෝසත් සිරිත හා ශාසන ඉතිහාසය පිලිබඳව පොතපතින් ලබාදෙන දැනුමට නොදෙවෙනි දැනුමක් චිත්‍රකලාව මගින් ලබාදීමට හෙළ කලාකරුවන් උත්සුකවී ඇත. අනුරාධපුර යුගයේ පටන් නූතන යුගය දක්වා ඇති සිතුවම් එයට නිදසුන් සපයයි. ඒ අනුව නූතන යුගයට අයත් බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් අඳින ලද චිත්‍ර ශිල්පියා වන්නේ,
1. ඇම් සාර්ලිස් මහතා ය.
2. සෝලියස් මෙන්දිස් මහතා ය.
3. රිචඩ් නික්සන් මහතා ය.
4. ජෝර්ජ් කීට් මහතා ය.
5. සෝමබන්දු විද්‍යාපති මහතා ය.

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, 2020 අගෝස්තු

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

**බෞද්ධ ශිෂ්ටාචාරය ii** | 45 | s | ii | අමතර කියවීම් කාලය මිනිත්තු10

**පැය තුනයි**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

**උපදෙස්**

* i. කොටසින් ප්‍රශ්න දෙකක් ද, ii කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමිවේ.

### i කොටස

(මෙම කොටසින් ප්‍රශ්ණ දෙකක් පමණක් ලියන්න)

1. i. වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම ගෙනහැර දක්වන්න.
ii. මිනිස් සංහතියේ ඒකත්වය සනාථ කිරීමට අදාලව බුදුරදුන් ඉදිරිපත් කළ ඉගැන්වීම් හතරක් පෙන්වා දෙන්න.
iii. පවුල් සංස්ථාව තුළ මවක් වශයෙන් කාන්තාවට බුදුරදුන් උරුම කරදුන් සමාජ තත්වය නිදසුන් දෙකක් ඇසුරින් පහදන්න.
iv. මක්ඛලී ගෝසාල ශාස්තෲවරයාගේ දර්ශනය ගෙනහැර දක්වන්න.
v. සොළොස් මහා ජනපද නම් කරන්න.

2. i බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ගුණය හඳුන්වන්න.
ii බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයින් විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ ක්‍රම හතර නිදසුන් මගින් දක්වන්න.
iii ආගමික සහනශීලිත්වය බුද්ධ චරිතයෙන් ඔපවත් වන අවස්ථා දෙකක් නිදසුන් මගින් පහදන්න.

iv ශාසනික උන්නතිය සඳහා ආනන්ද හිමියගෙන් සිදුවූ සේවය කෙටියෙන් දක්වන්න.

v "නිධීනංව පවත්තාරං"යන ගාථා පාඨය ඇතුළත් ධම්ම පද ගාථාව තේරුමද සහිතව ලියා දක්වන්න.

3. i ආරක්ඛ සම්පදාව යනු කුමක්දැයි මූලාශ්‍රය මගින් පෙන්වා දෙන්න .

ii දසපින් කිරියවත් නම් කරන්න.

iii කුසල් අකුසල් විනිශ්චය කිරීමට අදාල බෞද්ධ නිර්ණායක හතරක් ඉදිරිපත් කරන්න.

iv මහා මංගල සූත්‍රයේ දැක්වෙන මංගල කරුණු අටක් නම් කරන්න.

v සිගාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිසාව නියෝජනය කරන පිරිසගේ යුතුකම් හා වගකීම් වෙන් වෙන්ව දක්වන්න.

**ii කොටස**

(මෙම කොටසින් ප්‍රශ්ණ තුනක් පමණක් ලියන්න)

4. i වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේ සැකැස්ම පිළිබඳව හැඳින්වීමක් කොට ධර්ම ශාස්ත්‍රීය සංවර්ධනය විෂයෙහි ඉන් ලැබුන
දායකත්වය ඇගයීමට ලක්කරන්න.

ii අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාවන් තුළණාත්මකව අගයන්න.

5. i භෞතික සම්පත් කළමනාකරණයට අදාල බෞද්ධ ඉගැන්වීම් තුළින් වත්මන් සමාජයට ගතහැකි ආදර්ශ පෙන්වා දෙන්න.

ii තරගකාරී ජීවන රටාව නිසා ඇතිවන බොහෝ සමාජ ගැටලු වලට අල්පේච්ඡ ජීවන රටාව විසඳුම් සපයන බව ප්‍රකට
කරන්න.

6. i දෙවන ධර්ම සංගායනාවට අදාල පසුබිම පැහැදිලි කොට, එය ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරන්නේ දැයි
විමසීමට ලක්කරන්න.

ii බෞද්ධ ස්තූපයේ ප්‍රභවය පිළිබඳව විමසීමක් කොට, ස්තූපාකෘති පිළිබඳ සනිදර්ශනාත්මක ව විස්තර කරන්න.

7. i ථායිලන්ත ජන සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වී ඇති ආකාරය පරීක්ෂා කරන්න

ii අනුරාධපුර මහාවිහාරයෙන් සිදු වූ ආගමික හා ජාතික මෙහෙවර අගයන්න.

8. i බුදුසමය ඇසුරෙන් ගොඩ නැගුණු ශ්‍රී ලාංකේය සිරිත් විරිත් හා සාරධර්ම පුද්ගලයා හා සමාජය අතර බැඳීම් වර්ධනය කිරීමට හේතු වූ අයුරු පහදන්න.

ii මෙරට ජන කවියට මෙන්ම ගීත සාහිත්‍යය කෙරෙහිද බුදුදහමේ ආභාසය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පැහැදිලි
කරන්න.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය 2020 පෙරහුරු ප්‍රශ්න පත්‍රය

බෞද්ධ ශිෂ්ටාචාරය ලකුණු ලබාදීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 3 | 26 | 4 |
| 02 | 4 | 27 | 1 |
| 03 | 2 | 28 | 4 |
| 04 | 5 | 29 | 3 |
| 05 | 5 | 30 | 5 |
| 06 | 1 | 31 | 2 |
| 07 | 2 | 32 | 3 |
| 08 | 4 | 33 | 2 |
| 09 | 3 | 34 | 1 |
| 10 | 3 | 35 | 5 |
| 11 | 1 | 36 | 1 |
| 12 | 2 | 37 | 5 |
| 13 | 4 | 38 | 4 |
| 14 | 1 | 39 | 2 |
| 15 | 5 | 40 | 4 |
| 16 | 3 | 41 | 5 |
| 17 | 1 | 42 | 5 |
| 18 | 4 | 43 | 3 |
| 19 | 2 | 44 | 2 |
| 20 | 3 | 45 | 3 |
| 21 | 5 | 46 | 1 |
| 22 | 5 | 47 | 2 |
| 23 | 3 | 48 | 3 |
| 24 | 1 | 49 | 4 |
| 25 | 1 | 50 | 4 |

## ii පත්‍රය

1 i. වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම ගෙනහැර දක්වන්න.

- මනුස්මෘතියේ 90 වන ශ්ලෝකයේ වෛශ්‍ය වර්ණයට අදාල ස්වධර්ම දක්වා ඇත.
- පශූනං රක්‍ෂනං දාන - මිජ්‍යාධ්‍යයන මේව ච
  වණික් පථං කුසීදං ච වෛශ්‍යස්‍ය කෘෂි මේව ච (මනු 1. 90)

පශු පාලනය, දන්දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළදාම, මුදල් පොළියට දීම හා කෘෂි කර්මාන්තය යනුවෙන් දැක්වෙන්නේ එම කරුණු බව ( ලකුණු 4යි)

ii. මිනිස් සංහතියේ ඒකත්වය සනාථ කිරීමට අදාලව බුදුරදුන් ඉදිරිපත් කළ ඉගැන්වීම් හතරක් පෙන්වා දෙන්න.

- මිනිස් සංහතියේ විවිධත්වයක් ඇතිකරලීම උදෙසා බමුණන් ඉදිරිපත් කළ වර්ණ සංකල්පය බුදුරදුන් විසින් ප්‍රතික්ෂේප කර ඇත. මිනිස් සංහතියේ ඒකත්වය සනාථ කරලීම උදෙසා සූත්‍ර රැසක තොරතුරු වාර්තා කෙරෙන බව
- වාසෙට්ඨ සූත්‍රය තුළින් සත්වයාගේ පහළවීම ජීව විද්‍යාණුකූල පදනමක් මත පිහිටා කරුණු ඉදිරිපත් කළ අයුරු "යථා ඒතාසු ජාතීසු ලිංගං ජාති මයා පුථූ " යන ඉගැන්වීමෙන් පැහැදිලිවන බව

- යෝන හා කාම්භෝජ ප්‍රදේශයන්හි වර්ණ හතර වෙනුවට ඇත්තේ වර්ණ දෙකක් බවත්. එම වර්ණ දෙක වුව කලින් කලට මාරුවන බව බුදුරදුන් අස්සලායන සූත්‍රය තුළින් පෙන්වා දෙමින් වර්ණ සංකල්පයේ පවත්නා අතාත්වික බව දක්වාලයි. ඒ තුළින් සමාජ විද්‍යාත්මක පදනමක් දැකිය හැකි බව විද්වත් මතය බව
- උපතින් වසලයෙක්වත් බ්‍රාහ්මණයෙක්වත් ඇතිනොවන බව වසල සූත්‍රයෙන් ආචාරවිද්‍යාත්මක පදනමක පිහිටා කරුණු ඉදිරිපත් වන බව
- කිසිදු ජාතියක් අදූෂිතව අමිශ්‍රව නොපවතින බවත් අනෙකුත් ජාතීන් හා මිශ්‍රව උපජාතීන් බිහිවන බවත් ඓතිහාසික තොරතුරු ඇසුරු කරගෙන බුදුරදුන් කරුණු ඉදිරිපත් කර ඇති අයුරු අම්බට්ඨ සූත්‍රය තුළින් හෙළිවන බව. එයට අනුව අම්බට්ඨ බමුණාගේ පරපුරේ ඉතිහාසය විමසීමේදී හත්මුතු පරපුරේ ආරම්භක සාමාජිකයා ශාක්‍යයන්ගේ දාසියකගේ කුසින් උපන් දරුවෙකුගෙන් පැවැත එන බව පෙන්වා දෙයි. මේ තුළින් ඓහාසික පදනම පැහැදිළි වේ.

නීතිය ඉදිරියේ කුල භේදය නොසැලෙකෙන බවත් ශුද්‍ර වංශිකයාට මෙන්ම බ්‍රාහ්මණ වංශිකයායාට ද වැරද්දේ ස්වභාවය අනුව දඩුවම් ලැබෙන බව මධුර සූත්‍රය තුළින් පිළිබිඹු කෙරෙන බව. ඒ තුළ නීතිමය පදනමක් පිළිබිඹු කෙරෙන බව ( ලකුණු 4යි)

iii. පවුල් සංස්ථාව තුළ මවක් වශයෙන් කාන්තාවට බුදුරදුන් උරුම කරදුන් සමාජ තත්වය නිදසුන් දෙකක් ඇසුරින් පහදන්න.

- මව සහ පියා ලෝකය මැවූ මහා බ්‍රහ්මට, පූර්ව ආචාර්යවරුනට සමාන කිරීම, (බ්‍රහ්මාති මාතා පිතරෝ පුබ්බාචරියාච වුච්චරෝ)
- මවට පියාට සැළකීම මංගල කරුණක් බව මංගල සූත්‍රයේ මාතා පිතු උපට්ඨානං යන්නෙන් පැහැදිලි කෙරෙන බව
- මවට පියාට නොසලකන්නා පිරිහීමට පත්වන බවත් එය වසල කරුණක් බවත් පරාභව හා වසල සූත්‍රවල දක්වෙන බව
- "බුද්ධෝවිය මාතා" යන්නෙන් මව නිවසෙහි බුදුන් වශයෙන් ගෞරවාදරයට පත්වන බවත් මව මැරීම ආනන්තරිය පාප කර්ම ගණයට ගැනෙන්නක් ලෙසත් සඳහන්වෙන බව

බුදුරදුන් පවා තම මෑණියන්ට හා සුළු මවට උපකාර කිරීමට යොමුවීමෙන් කාන්තාව ගෞරවණීය තත්වයට පත්ව ඇතිබව. යනාදී මෙබඳු කරුණු වලින් හතරක් පිළිබඳව කෙටියෙන් දක්වා තිබීම ප්‍රමාණවත්ය
( ලකුණු 4යි)

iv. මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාගේ දර්ශනය ගෙනහැර දක්වන්න.

- "--- නත්ථි මහාරාජ හේතු නත්ථි පච්චයෝ සත්තානං සංකිලේසාය අහේතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති. නත්ථි හේතු නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. -------" යනුවෙන් මෙතුමාගේ ඉගැන්වීමට අනුව සෑම සත්වයෙක්ම කල්ප 84000 ක් සසර ගමන් කිරීමෙන් පාරිශුද්ධිය උදාවන බවත් එය නියතියක් බවත් සත්වයාට විඳීමට සිදුවන දුක සැප ආදිය ද කෙළෙසීම හා පාරිශුද්ධිය ද කිසිදු බලපෑමකින් තොරව අහේතුකව සිදුවන බවත් විමුක්තිය සඳහා කළ යුතු පිළිවෙතක් නොමැතිබව දීඝනිකායේ සාමඤ්ඤ ඵල සූත්‍රයේ මෙම දර්ශනය විස්තර කෙරෙන බව.
- එහි දක්වෙන සූත්‍රාගත කරුනුවලට අනුව මොහුගේ දර්ශනය තුළ පහත දක්වෙන ඉගැන්වීම් ඉදිරිපත් කෙරෙන බව.

1. නියතිවාදය
2. සංසාරශුද්ධිවාදය
3. අකිරියවාදය
4. අහේතු අප්පච්චයවාදය
5. පරිණාම වාදය
6. දෛව වාදය මෙබඳු කරුණු ඇසුරු කරගෙන පිලිතුර සකස් වියයුතු බව ( ලකුණු 4යි)

v. සොළොස් මහා ජනපද නම් කරන්න.

අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, කුරු, පංචාල, මත්ස්‍ය, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්භෝජ ( ලකුණු 4යි)

2. i බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ගුණය හඳුන්වන්න.

සම්මා සම්බුද්ධ

- මැනවින් තමා ම අවබෝධ කළේ ය, අවබෝධ කරයි, අවබෝධ කරන්නේය, (සම්මා සයමෙව අබුජ්ඣි, බුජ්ඣති, බුජ්ඣිස්සතීති සම්මාසම්බුද්ධෝ) යන අරුතින් බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධ වන බව.
- දැනගත යුතු සියලු ධර්ම දැන ගෙන අවබෝධ කළ බැවින් ද, සාක්ෂාත් කළ යුතු සියලු ධර්ම සාක්ෂාත් කළ බැවින් ද, වැඩිය යුතු සියලු ධර්ම වැඩිය යුතු ධර්ම ලෙස වැඩූ බැවින් ද, ප්‍රහණී කළ යුතු සියලු ධර්ම, ප්‍රහීණ කළ යුතු ධර්ම ලෙස ප්‍රහීණ කළ බැවින් ද 'බුද්ධ' නම් වන බව හා ඒවා තමා විසින් ම සිදු කරන ලද බැවින් සම්මා සම්බුද්ධ යැයි කියන බව.
- තුන් කල්හි ම පැවති - පදරුත් සියල් ලොව ඇති
  අතැඹුල සෙ දැන ගති - එයින් සම්මා සම්බුදුන යෙති

(බුදුගුණ අලංකාරය)

ii බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයින් විසින් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයූ ක්‍රම හතර නිදසුන් මගින් දක්වන්න.

- බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයින් විසින් නගන ලද ප්‍රශ්ණවලට පිළිතුරු සැපයූ ක්‍රම හතරක් පිළිබඳව පෙළ දහමේ තොරතුරු දැක්වේ.
  1. ඒකාංශ ව්‍යාකරණිය = ඍජු පිළිතුරු සැපයීම ( ආලවක සූත්‍රය)
  2. විභජ්ජ ව්‍යාකරණිය = විශ්ලේශණාත්මක ඉදිරිපත් කිරීම ( චූල්ලකම්ම විභංග සූත්‍රය)
  3. පටිපුච්ඡා ව්‍යාකරණිය = ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු සැපයීම ( චූල්ල සච්චක සූත්‍රය)
  4. ඨපනීය = පිළිතුරුලබා දීමෙන් වැළකී සිටි ප්‍රශ්න ( චූල්ල මාලුංක්‍ය පුත්ත සූත්‍රය) ( ලකුණු 4යි)

iii ආගමික සහනශීලිත්වය බුද්ධ චරිතයෙන් ඔපවත් වන අවස්ථා දෙකක් ගෙනහැර දක්වන්න.

1. බුදුරජාණන් වහන්සේ විවේක අවස්ථාවන්හිදී අන්‍යාගමික ආශ්‍රම වලට වැඩමකර ඔවුන් සමග දාර්ශනික ධර්ම කරුනු පිළිබඳව සුහද පිළිසඳරෙහි යෙදීම.
එසේ අන්‍යාගමික අශ්‍රමයන්ට වැඩම කරනවිට උන්වහන්සේ පිළිගැනීමට යොමු වූ අයුරු සූත්‍ර ගණනාවකින් තොරතුරු හෙළිවන බව ( මහා සකුළුදායි පරිබ්‍රාජක විසින් තම ආරාමයට බුදුරදුන්ගේ වැඩම කිරීම අපේක්ෂාවෙන් උස්හඬින් කතා කළ පිරිස නිහඬ කළ අයුරු මහා සකුළුදායි සූත්‍රයෙන් හෙළිවන බව වච්ඡගොත්තපරිබ්‍රාජක තම ආශ්‍රමයට වැඩමකළ බුදුරජාණන් වහන්සේ පිළිගත්තේ එන්න ස්වාමිනී වැඩම කරන්න ඔබ වහන්සේ අද පැමිනෙන්නේ බොහො කලකට පසුවයි. ආසනය පනවා ඇත. යන සුහද ආමන්ත්‍රනයෙනි.)

2. ඇතැම් ආගමික ඉගැන්වීම්වල ඇති හරවත් දේ ඇගයීමට ලක්කිරීම හා අන්තගාමීව පවත්නා ඉගැන්වීම් සංස්කරණයකොට පිළිගැනිම
උදා - නිඝණ්ඨනාථපුත්තගේ ඉගැන්වීම්වල එන පඤ්ච විරමණය වෙනුවට පඤ්ච සීලය ඉදිරිපත් කිරීම, පරම අවිහිංසාවාදී නොවී අවිහිංසාවාදීවීම, වස්විසීම යන කරුණු
3. වෙනත් ආගමිකයින්ට බුදුරදුන් ධර්මය දේශනා කරණු ලැබුවේ ඔවුහු එම ආගමික මතවාදයන්ගෙන් මුදවාගෙන තම ආගමික මතවාදයට අවනතකරලීමේ අභිලාසයෙන් නොවන බව
උදා - නිග්‍රෝධ පරිබ්‍රාජකට බුදුරදුන් ධර්මය දේශනා කිරීමෙන් අනතුරුව කරන ලද ප්‍රකාශය, උපාලි ගෘහපති හා සීහ සේනාධිපතිට කරන ලද ප්‍රකාශයන්
4. බුදුරදුන් වෙත පැමිණි ආජීවක හා පරිබ්‍රාජකාදීන් සුහදව පිළිගෙන ගැටලු වලට විසඳුම් ලබාදීම
( ලකුණු 4යි)

iv ශාසනික උන්නතිය සඳහා ආනන්ද හිමියගෙන් සිදුවූ සේවය කෙටියෙන් දක්වන්න .

- ධර්ම භාණ්ඩාගාරික වශයෙන් බුදුරදුන් දේශිත ධර්මය ආරක්ෂාකරලීම සඳහා කටයුතු කිරීම
- භික්ෂුණී සමාජය ආරම්භකිරීමට දායකත්වය ලබාදීම
- බුදුරදුන්ගේ නිත්‍ය උපස්ථාදායක වශයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටුකිරීම

- බුදුරජාණන් වහන්සේ වෙනුවට උන්වහන්සේ වෙනුවෙන් පූජා පැවැත්වීමට බෝධියක් රෝපනය කිරීම
- බුද්ධ පරිනිර්වාණයෙන් පසුව පවත්වන ලද පළමු ධර්ම සංගායනාවේදී ආනන්ද හිමියන්ගේ දායකත්වය අත්‍යාවශ්‍යවීම හා සූත්‍ර පිටකය ආරක්ෂාකර ගැනීමේ වගකීම භාරගැනීම ( ලකුණු 4යි)

v නිධීනංව පවත්තාරං යන ගාථාව තේරුමද සහිතව ලියා දක්වන්න.

- නිධීනංව පවත්තාරං - යං පස්සේ වජ්ජ දස්සිනං
  නිග්ගය්හවාදීං මේධාවිං - තාදිසං පණ්ඩිතං භජේ
  තාදිසං භජමානස්ස - සෙයෝ හෝති න පාපියෝ

  යමෙක් නිධානයක් දක්වන්නෙකු මෙන් කෙනෙකුගේ ඇති වරද දකී ද එයට තරවටු කොට අවවාද කරයි ද එබඳු වූ බුද්ධිමත් පණ්ඩිතයකු සේවනය කල යුතුය. එබඳු කෙනෙකු ඇසුරු කරන්නාට වැඩක් ම වේ . අවැඩක් නොවේ. ( ගාථාවට ලකුණු 2යි තේරුමට 2යි)

3. i ආරක්ඛ සම්පදාව යනු කුමක්දැයි මූලාශ්‍රය මගින් පෙන්වා දෙන්න .

- කක්කරපත්ත නම් නියම් ගම් වැසි දීඝජානු කෝලිය පුත්‍රයාගේ ඉල්ලීමට අනුව මෙලොව පරලොව සුව පිණිස දේශනා කළ ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ මෙලොව දියුණුවට අදාලව දේශනා කළ ධර්ම කරුණු අතර දෙවැන්න ආරක්ඛ සම්පදාව බව.
- ඒ අනුව ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන පරිදි ආරක්ඛ සම්පදාව යනු " ව්‍යාඝ්‍රපාදය ආරක්ෂා සම්පත්තිය යනු මෙලොව කුල පුත්‍රයෙකු විසින් උට්ඨාන වීර්යෙන් බාහු බලයෙන් දහදිය හෙළා රැස්කරන ලද, උපදවන ලද දැහැමි ධනය රජවරු පැහැර නොගනිද්ද, සොරු පැහැර නොගනිද්ද, ගින්නෙන් විනාශ නොවෙත්ද, ජලයෙන් විනාශ නොවෙත්ද, අයහපත් ඥාතීන් විනාශ නොකරත් ද යනුවෙන් ආරක්ෂාව තහවුරු කරගෙන අවශ්‍ය කටයුතු කරයිද එය ආරක්ෂා සම්පත්තියයි" යනුවෙන් විවරණය කර තිබීම ප්‍රමාණවත්ය.

(ලකුණු 4යි)

ii දසපින් කිරියවත් නම් කරන්න.

- දානං සීලං ච භාවනා - පත්ති පත්තානු මෝදනා
  වෙය්‍යාවච්චා පචායන්ති - දේශනා සුති දිට්ඨුජ්ජු යනුවෙන් දැක්වෙන පරිදි දානය, සීලය, භාවනාව, පත්තිදාන හෙවත් පින්දීම, පත්තානුමෝදනා හෙවත් පින් අනුමෝදන්වීම, වෙය්‍යාවච්ච හෙවත් වතාවත් ඉටුකිරීම, අපචායන හෙවත් පිදිය යුත්තන්ට පිදීම, ධම්ම දේශනා හෙවත් අන්‍යයන්ට ධර්ම දේශනා කිරීම, ධර්මය ශ්‍රවණය කිරීම,දිට්ඨිජ්ජු කම්ම හෙවත් දෘෂ්ටිය ඍජු කරගැනීම යනුවෙන් දැක්වෙන්නේ එම කරුණු දහය බව
  (ගාථාව පමණක් ලියා ඇත්නම් ලකුණු දෙකයි වෙන් වෙන්ව කරුණු දක්වා ඇත්නම් ලකුණු 4යි)

iii කුසල් අකුසල් විනිස්චය කිරීමට අදාල බෞද්ධ නිර්ණායක හතරක් ඉදිරිපත් කරන්න.

- අංගුත්තර නිකායේ ආධිපතෙය්‍ය සූත්‍රයේ සඳහන් අධිපති ධර්ම තුන සැළකිල්ලට ගැනීම
  1.අත්ථාධිපතෙය්‍ය (ක්‍රියාවක් සිදුකිරීමට පෙර තමා අධිපතිකොට සලකා)
  2.ලෝකාධිපතෙය්‍ය (ලෝකය හෙවත් තමා අවට සමාජය අධිපතිකොට සලකා)
  3. ධම්මාධිපතෙය්‍ය (ධර්මය අධිපතිකොට සලකා)
- සංයුක්ත නිකායේ වේළුද්වාර සූත්‍රයේ සඳහන් අත්තුපනායික ධර්ම පර්යායට අනුව
- අම්බලට්ඨික සූත්‍රයේ සඳහන් නිර්ණායකයන්ට අනුව - කැඩපතකින් බලා සිරුර සකස්කරගන්නාක් මෙන් සිදුකිරීමට යන ක්‍රියාව තමාගේ අයහපත පිණිස හේතුවේද? අනුන්ගේ අයහපත පිණිස හේතුවේද? තමන්ගේ හා අනුන්ගේ අයහපත පිණිස හේතුවේදැයි නැවත නැවත සිතා කළයුත්ත නොකළ යුත්ත තීරණය කිරීම
- ධම්ම පදයේ දැක්වෙන පරිදි පදුට්ඨ මනසින් හෙවත් නරක චේතනාවෙන් කියන කරන අකුසල කර්මයන්ට ලැබෙන දුක් විපාක ගොනුපස පස එන රිය සක මෙන් පීඩාකාරීවන බව. එසේම ප්‍රසන්න මනසින් හෙවත් යහපත් චේතනාවෙන් කියන කරන කුසල කර්මයන්ට ලැබෙන සැප විපාක තමා පසුපස එන සෙවැනැල්ල මෙන් සුවදායක බව

- "ධම්මපදයේම සඳහන් න තං කම්මං කතං සාධු --- "යන ගාථාවෙන් දැක්වෙන පරිදි පසුතැවීමෙන්, කඳුලු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවන ක්‍රියා නොකිරීම මැනවි. එසේම "තඤ්ච කම්මං කතං සාධු---" ගාථාවෙන් දැක්වෙන පරිදි යමක් කොට පසුතැවීමට සිදු නොවේද සතුටු සිතින් විපාකය විඳිය හැකිවේද එවැනි ක්‍රියා සිදුකිරීම මැනවි.
- කාලාම සූත්‍රයේදී අනුස්සවය, පරම්පරාව, පිටක සම්ප්‍රදාය ආදී නිර්ණායක ප්‍රාමාණික වශයෙන් නොසලකා පුද්ගලයෙකු ක්‍රියාකළයුතු ආකාරය පැහැදිලි කරමින් මෙය කුෂලය සඳහා හේතුවේ මෙය අකුෂලය සඳහා හේතුවේ යනුවෙන් විමසා බලා තීරණයකට එළඹෙන ලෙස දැක්වීම
  (ලකුණු 4යි)

iv මහා මංගල සූත්‍රයේ දැක්වෙන මංගල කරුණු අටක් නම් කරන්න.

1. අසේවනාච බාලානං - බාලයන් ඇසුරු නොකිරීම 2. පණ්ඩිතානංච සේවනා - පණ්ඩිතයන් ඇසුරු කිරීම
3. පූජාච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම 4. පතිරූපදේස වාසෝච - සුදුසු පෙදෙසක විසීම
5. පුබ්බේච කතපුඤ්ඤතා - පෙරකළ පින් ඇතිබව 6. අත්ථ සම්මාපණීධිච - සිතමනාසේ පිහිටුවා ගැනීම
7. බාහුසච්චංච - බෙහෝ ඇසූපිරූ තැන් ඇතිබව 8. සිප්පංච ශිල්පයෙහි දක්‍ෂ බව
9. විනයෝච සුසික්ඛිතෝ - තිදොර මනාව හික්මවීම 10. සුභාසිතාච යාවාචා - යහපත් වචන කතා කිරීම
11. මාතා උපට්ඨානං - මවට උපස්ථානකිරීම 12. පිතු උපට්ඨානං පියාට උපස්ථාන කිරීම
13. පුත්ත දාරස්ස සංගහෝ - අඹු දරුවන්ට සංග්‍රහ කිරීම 14. අනාකුලාච කම්මන්තා - නිරවුල් කර්මාන්ත කිරීම

යනාදි වශයෙන් සඳහන් මංගල කරුණු 38 න් අටක් දක්වා තිබීම ප්‍රමානවත්ය ( ලකුණු 4යි)

v සිගාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිසාව නියෝජනය කරන පිරිසගේ යුතුකම් හා වගකීම් වෙන් වෙන්ව දක්වන්න.

- දකුණු දිසාව නියෝජනය කරන සමාජ පිරිස ගුරුවරුන් හා ශිෂ්‍යයන්ය. එම අයට වෙන් වූ යුතුකම් පහ බැගින් දක්වේ
- ශිෂ්‍යයාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතුකම්

1. ගුරුවරයා දුටුවිට හුනස්නෙන් නැගිටීම (උට්ඨානේන)
2. උපස්ථාන කිරීම (උපට්ඨානේන)
3. ගුරුබසට සවන්දීම (සුස්සූසාය)
4. කුඩු මහත් වැඩකරදීම (පාරිචරියාය)
5. මැනවින් ශිල්ප හැදෑරීම (සක්කච්චං සිප්පපටිග්ගහනේන)

- ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට

1. මැනවින් හික්මවීමම (සුවිනීතං විනෙන්ති)
2. මැනවින් ඉගැන්වීම (සුග්ගහිතං ගහාපෙන්ති)
3. සියළුම ශිල්ප ශාස්ත්‍ර කියාදීම (සබ්බ සිප්පසුතංග සමක්ඛායිනෝ හවන්ති)
4. මිත්‍ර වර්ගයාට හඳුන්වාදීම (මිත්තාමච්චේසු පරිවේදෙන්ති)
5. ශිෂ්‍යයාගේ ආරක්‍ෂාව තහවුරු කිරීම (දිසාසු පරිත්තානංකරොන්ති)

4. i වික්‍රමශිලා විශ්ව විද්‍යාලයේ සැකැස්ම පිළිබඳව හැඳින්වීමක් කොට ධර්ම ශාස්ත්‍රීය සංවර්ධනය විෂයෙහි ඉන් ලැබුන
   දායකත්වය ඇගයීමට ලක්කරන්න.

- නාලන්දා විශ්ව විද්‍යාලයේ තන්ත්‍රයාන බුදු සමය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ කම්පාල තෙරණුවන් පළකළ අදහසට ගරුකරමින් ධර්මපාල රජතුමා වික්‍රමශිලාවේ පළමු සංඝාවාසය ඉදිකල බවත් මෙහි නඩත්තුව සඳහා ගම්වර පූජාකළ බව
- පසුව බලයට පත් නයපාල රජු හා කීර්තිපාල රජු මෙහි අභිවෘද්ධියට කටයුතු කළ බව
- මනා සැළසුම් සහගතව නිර්මිත වික්‍රමශිලාව මධ්‍යයෙහි ප්‍රධාන දේශන ශාලාව ඉදිකළ අතර එය විද්‍යාගෘහ නමින් ප්‍රචලිතව පැවැති බව
- විද්‍යාගෘහයට ඇතුළුවීමට දොරටු හයක් පැවැති අතර ඒ සෑම දොරටුවකම සංඝාවාසයක් ඉදිකරතිබූ බව
- විශාල තාප්පයකින් වටකොට තිබූ මුළු විශ්ව විද්‍යාල භූමිය අලංකාර වූ අතර එක් එක් සංඝාරාමයට ද්වාර පණ්ඩිත නමින් හැඳින්වුණු පඬිවරුන් හය දෙනෙක් සිටි බව

- ක්‍රි. ව. 983 - 995 අතර කාලය තුළ පහත සඳහන් ද්වාරපණ්ඩිතවරුන් විද්‍යාමණ්ඩප භාරව කටයුතු කර ඇති බව
  1. රත්නාකර ශාන්ති - පෙරදිග දොරටුව
  2. වාගිශ්වර කීර්ති - බටහිර දොරටුව
  3. නරෝපා - උතුරු දොරටුව
  4. පඥාකරමති - දකුණු දොරටුව
  5. රත්නවජ්‍ර - පලමුවැනි දොරටුව
  6. ඥාන ශ්‍රී මිත්‍ර - දෙවැනි දොරටුව
- මෙහි විෂය මාලාව නාලන්දා විශ්ව විද්‍යාලයේ විෂය මාලාවට සමාන බවත් ශ්‍රාවකයාන හා මහායාන බුදුසමය සාමාන්‍ය පරිදි ඉගැන්වීම සිදු වූ අතර තන්ත්‍රයාන බුදුසමය පිළිබඳව සුවිශේෂීව ඉගැන්වීම් කටයුතු සිදුකෙරුන බව
- විශ්ව විද්‍යාලයේ කටයුතු මණ්ඩල ගණනාවකින් සිදු කෙරන බව
  1. ආචාර්ය මණ්ඩලය 2. අධ්‍යාපන මණ්ඩලය 3. පරිපාලන මණ්ඩලය 4. විනය මණ්ඩලය 5. ප්‍රවේශ මණ්ඩලය
- අභිධර්මය, ව්‍යාකරණ, තන්ත්‍රයාන, යන විෂයන් සඳහා වෙන් වූ ගොඩනැගිලි තිබුන බව
- ආචාර්යවරුන් 108 දෙනෙක් ද ඒ හා සමාන නිළදාරීන් හයදෙනෙක් පරිපාලන කටයුතු සඳහාද වෙන්ව සිටි බව
- උපාධි මෙන්ම පස්චාත් උපාධි පිරිනැමු මෙම විශ්ව විද්‍යාලයද ජගත් කීර්තියට පත්ව තිබූ බව

ii අශෝක රජතුමාගේ හා කණිස්ක රජතුමාගේ ශාසනික සේවාවන් තුලනාත්මකව විවරණය කරන්න.

ii අශෝක රජතුමාගේ හා කණිස්ක රජතුමාගේ ශාසනික සේවාවන් තුලනාත්මකව විවරණය කරන්න.

**අශෝක රජතුමාගේ රජතුමාගේ ශාසනික සේවාවන්**

- අශෝක රජතුමා මොග්ගලී පුත්තතිස්ස හිමියන්ගේ උපදෙස් ලබමින් ශාසනික සේවාවට යොමුවිය.
- දුසිල් මහණුන් 60000ක් සසුනෙන් නෙරපා භේද භින්නව සිටි භික්ෂූන් සමගි කරවා ශාසන සංශෝධනයක් සිදු කොට තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම.
- භාරතයේ විවිධ ප්‍රදේශ සහ විදේශ රටවල් කිහිපයකම ධර්මය ව්‍යාප්ත කිරීම පිණිස ධර්මදූත කණ්ඩායම් පිටත්කර යැවීම.
- වෙහෙර විහාර රාශියක් කරවූ බව මහා වංශය ආදී වංශකතා සාහිත්‍යයන්හි සඳහන්ව ඇති අතර සාංචි ස්තූපය එතුමා විසින් ගොඩනංවන ලද ප්‍රධාන ස්තූපය වීම.
- සෙල්ලිපි පුවරු ලිපි ටැම් ලිපි ආදිය මගින් හා ධර්ම මහාමාත්‍යවරුන් මගින් බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කිරීම (යුක්තක රජ්ජුක වැනි පුද්ගලයින් පත් කිරීම)
- කථාවත්තුප්පකරණය රචනාකිරීමට මොග්ගලීපුත්ත තිස්ස තෙරුන්ට පහසුකම් සැළස්වීම
- තම පුත්‍රයා දියණිය සසුන්ගත කොට විදේශ ධර්ම දූත සේවාවේ යෙදවීම.
- ලුම්බිනිය, සාරානාත්, ආදී බුද්ධ චරිතය හා සම්බන්ධ වැදගත් ස්ථාන වන්දනා කරමින් ඒ ස්ථාන දියුණු කොට අශෝක ස්ථම්භ පිහිටුවීම.
- පඤ්චසීල ප්‍රතිපත්තිය අභය, දානය මිනිසුන් සඳහා මෙන්ම සතුන් සිව්පාවුන් සඳහාද ආරෝග්‍යශාලා ඉදිකිරීම මල්වතු උයන් වතු ඉදිකිරීම ආදී කටයුතු මගින් සිදුකළ ශාසනික මෙහෙවර ආදී උදාහරන සහිතව දක්වාලිය යුතුය.

**කණිස්ක රජතුමාගේ ශාසනික සේවාවන්**

- පාර්ශව තෙරුන්ගේ උපදෙස් ලබමින් ශාසනික සේවාවට යොමුවිය.
- සර්වාස්තිවාදී සංගායනාවක් වූ හතරවැනි සංගායනාවට පූර්ණදායකත්වය සැපයීම
- එම සංගායනාවේදී සංගායනා වූ ධර්ම ග්‍රන්ථ තඹවත්වල ලියවා ශිලාමය මංජුසාවල අසුරා රජු විසින්ම ස්තූපයක නිදන් කිරීම
- ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්ථනයකොට සූත්‍ර පිටකයට අර්ථ නිරූපනය කරමින් ශ්ලෝක දස ලක්ෂයකින් සමන්විත උපදේශ ශාස්ත්‍රයද, විනය පිටකය සඳහා විනය විභාෂාවද අභිධර්ම පිටකය සඳහා අභිධර්ම මහා විභාෂා සංග්‍රහ කිරීමට යොමුවීම.

- මෙතුමා විසින් අඩි 500ක් උසට පෙෂාවෝර්හි මහා චෛත්‍යයක් ගොඩනගා සර්වඥ ධාතූන් නිදන් කිරීම
- භාරතයේ මධ්‍ය දේශයේ සිට කාෂ්මීරය හරහා මධ්‍ය අසියාව තෙක් දෙස් විදෙස් හි ධර්ම ප්‍රචාරය කිරීම.
- කණිෂ්ක පුරය නමින් නගරයක් කරවා කණිෂ්ක නමින් ස්තූපයක් කරවීම
- කණිෂ්ක මහාවිහාරය නමින් විහාරාරාමයක් කරවීම
- ධර්ම ශාස්ත්‍රීය සේවාවේ නිරත වූ ලේඛකයන්ට රාජ අනුග්‍රහය ලබාදීම
- කාෂ්මීරය මහා සංඝරත්නයට පූජා කිරීම
- කණිෂ්ක යුගයේ කාසිවල බුද්ධ ප්‍රතිමා නිර්මානය වී තිබීමෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණයට අනුබල දීම.

5. i භෞතික සම්පත් කළමනාකරණයට අදාල බෞද්ධ ඉගැන්වීම් තුළින් වත්මන් සමාජයට ගතහැකි ආදර්ශ පෙන්වා දෙන්න.

- භෞතික හා මානව සම්පත් කාර්යක්ෂමවත් ඵලදායීවත් මෙහෙයවීම සංවිධානය කිරීම කළමනාකරණය යන්නෙන් අදහස් කෙරේ.
- ගෘහස්ථ ජීවිතය හා සම්බන්ධ භෞතික සම්පත් කළමනාකරණය පැහැදිළි කරන වැදගත්ම ඉගැන්වීම ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන සමජීවිකතාවයි.
- ව්‍යාඝ්‍රපාදය මෙලොව කුලපුත්‍ර තෙමේ භෝගයන්ගේ අයද දැන භෝගයන්ගේ වැය ද දැන ඉතා වැඩිද නොවූ ඉතා අඩුද නොවූ සම වූ දිවිපැවැත්ම කෙරෙයි. මෙලෙසින් මගේ අය, වැය ඉක්මවා සිටියි. මෙසේ මගේ වැය, අය ඉක්මවා නොයයි.
- තරාදියක් ගෙන කිරන පුද්ගලයකු මෙපමණකින් එය උස් පහත් වේයැයි දන්නා සේ තමා උපයන ධනය වැය කිරීමේදී කෙසේ අයවැය කළමනාකරණය කරගන්නේද යන්න මෙයින් පැහැදිලි කෙරේ.
- සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ආකරයට ධනය කොටස් හතරකට බෙදා වැය කිරීමට ලබාදුන් උපදේශය තුළින් ද ආර්ථික කළමනාකරණයට අදාල වැදගත් උපදේශයක් සපයයි.
- චුල්ලවග්ගපාලියේ වත්තක්ඛන්ධකයේ ආගන්තුකවත, ආවාසිකවත, පිණ්ඩාචාරිකවත, අරඤ්ඤකවත, සේනාසනවත, ජන්තාඝරවත, වච්චකුටිකවත ආදී වූ වත් ආරාමික ජීවිතය තුළ අනුගමනය කළයුතු පිළිවෙත් රැසකි. මෙමගින් ද භෞතික සම්පත් කළමනාකරණය කරන්නේ කෙසේදැයි අවධාරණය කෙරේ.
- සංඝයා උදෙසා සංඝයාගේම පරිපාලන ක්‍රමයක් පිළිගන්නා සංඝ සංස්ථාව උපදින සියලු ලාභයන් සමූහයාගේ අවශ්‍යතාවන් ඉටුවන පරිදි ආරක්‍ෂා කරන්නටත් සංඝයාවෙත බෙදා දෙන්නටත් තනතුරු රාශියක් ඇතිකළ බව සේනාසන ගහාපක, භත්තුත්දේශක, භාණ්ඩාගාරික, චීවර පටිග්ගාහක, යනාදී තනතුරුවලින් තහවුරු වේ.
- ආනන්ද හිමියන්ට සිවුරු පිණිස පිළි 500 ක් ලැබුණු අවස්ථාවේදී රජු හා උන්වහන්සේ අතර ඇති වූ සංවාදය තුළින් ද සම්පත් කළමනාකරණයට අදාල ඉගැන්වීමක් ඉදිරිපත්කෙරේ.
- සංඝ සංවිධානය තුළ ක්‍රියාත්මක මෙකී සම්පත් කළමනාකරණය පිලිබඳ පරමාදර්ශ වත්මන් සමාජයේ පොදු සම්පත් ලෙස සැලකෙන පාසල, රෝහල, බස්රිය, දුම්රිය, විදුලිය, ජලය ආදිය භාවිතයේදී එකී සම්පත් ආරක්‍ෂා කරමින් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉහත දැක්වූ සංකල්ප උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වාදීම ප්‍රමාණවත්ය.

ii තරගකාරී ජීවන රටාව නිසා ඇතිවන බොහෝ සමාජ ගැටලු වලට අල්පේච්ඡ ජීවිතය විසඳුම් සපයන බව ප්‍රකට කරන්න.

- ආශාවන් සීමාකරගෙන අල්ප වූ අවශ්‍යතාවන් ඇතිව කටයුතු කිරීම අල්පේච්ඡතාවයි. ලද පමණින් සතුටුවීම, පහසුවෙන් පෝෂණය කළහැකිබව,කටයුතු බහුල නොවීම, සැහැල්ලු දිවිපෙවතක් ගතකිරීම ඉන්ද්‍රිය සංවරය යන මෙම ගුණාංගද අල්පේච්ඡ සංකල්පය තුළ අන්තර්ගතව ඇත.
- අල්පේච්ඡතාවට ප්‍රතිවිරුද්ධ මනොභාවය මහිච්ඡතාවයි. මහිච්ඡතාවය බොහො සමාජ ගැටලු වලට හේතුවේ.

- වර්තමාන සමාජයේ පුද්ගලයා එකිනෙකා අභිබවා යෑමට දරන උත්සහයේ ප්‍රතිපලයක් වශයෙන් සමාජයේ තරගකාරිත්වය හටගෙන තිබේ.
- තාෂ්ණාව මුල්කරගෙන නිරායාසයෙන් මිනිසා තරගකාරිත්වයට යොමුවේ. එයට අනුබලදෙන විවෘත ආර්ථික සමාජ රටාවක් අප ඉදිරියේ නිර්මාණය වී ඇත. එය තරගකාරිත්වයට මිනිසා පොළඹවයි.
- තෘෂ්ණාව මුල්කරගෙන ධනවත්වීමට දරන උත්සහය සමාජවිරෝධී සූරාකෑමේ මානසිකත්වයට මිනිසා පොළඹවයි. මේ නිසා මිනිසුන් අතර ගැටුම් වර්ධනය වීමෙන් සාමය බිඳවැටේ. මානව සබඳදතා බිඳවැටේ. මිනිසා තුළ වෛරය හා අතෘප්තිය වර්ධනය වී මානසික ව්‍යාකූල තත්වයක් ඇතිකරයි. මෙම සියලු අහිතකර මනෝභාවයන්ට මූළික හේතුව පුද්ගලයා අල්පේච්ඡතාවෙන් ඈත්වීමයි.
- තෘෂ්ණාව නිසා මිනිසා ලෞකික වශයෙන් විවිධ දුස්කරතාවලට හා විපත්වලට භාජනය වන ආකාරය බුදුරජාණන් වහන්සේ විසින් මහා දුක්ඛක්ඛන්ධ සූත්‍රයෙන් පැහැදිලි කර ඇත.

6. i දෙවන ධර්ම සංගායනාවට අදාල පසුබිම දක්වා එය ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සටහන් කරන්නේ දැයි විමසන්න .

**පසුබිම-**

- චුල්ල වග්ගපාලියේ සත්තසතිකඛන්ධකයට අනුව දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට අදාල පසුබිම වශයෙන් දක්වෙනුයේ වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත්කරන ලද දසවස්තුවයි
- පාචීනක හා පාවෙය්‍යක යන ප්‍රදේශ දෙකෙන් ධර්මධර විනයධර භික්ෂූන් වාසය කරන්නේ කොහේද යන ගැටලුවද මෙයට පදනම් වූ කරුණක් ලෙස දක්වේ.
- මහාදේව නම් හිමිනමක් විසින් රහතන් වහන්සේලා අවතක්සේරුවකට ලක්කරමින් ඉදිරිපත් කරන ලද කාරනා පහක් ද මේ සඳහා හේතු වූ බව සඳහන්වීම
- දසවස්තුව පිළිනොගත් කාකණ්ඩ පුත්ත යස හිමියන්ට වජ්ජිපුත්තක භික්ෂූන් දක්වූ දැඩි විරෝධය
- විවිධ මාර්ගයෙන් ලැබුන අවබෝධය නිසා කාලාශෝක රජුට ඇතිවූ සසුන පිරිසිදු කිරීමේ අවශ්‍යතාව

**සන්ධිස්ථානයක් සටහන් කරනබව -**

- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත්කරන ලද දසවස්තුව සබ්බකාමී මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රැස්වූ සංඝ සම්මේලනයේදී ධර්ම විනය විරෝධී අකැප වස්තුවක් සේ එකිනෙක විශ්ලේෂණය කොට ප්‍රතික්ෂේප කිරීම
- දසවස්තුවක් ප්‍රතික්ෂේප වීමත් සමග ශාසන විස්ථිතිය සඳහා එය ඉවහල්වීම
- වසර සියයක් මුළුල්ලේ අවිච්ඡින්නව පැවති ථෙරීය භික්ෂු පරම්පරාව ථෙරවාද හා මහා සාංඝික වශයෙන් දෙකොටසකට බෙදී මින් ඉදිරියට ක්‍රියාත්මක වීමට යොමුවීම .
- මෙයින් පසුව ක්‍රමයෙන් භීක්ෂු සාමග්‍රිය බිඳීගොස් නිකාය සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වෙමින් නව දාර්ශණික සංකල්ප ඒ හරහා සසුනට ඇතුලත්වීම

ii බෞද්ධ ස්තූපයේ ප්‍රභවය පිලිබඳව විමසීමක් කොට, ස්තූපාකෘති පිළිබඳ සනිදර්ශනාත්මකව විස්තර කරන්න.

**බෞද්ධ ස්තූපයේ ප්‍රභවය**

- ස්තූපය බෞද්ධයන්ගේ ප්‍රධානතම සංකේතයක් වන අතර එහි ආරම්භය බුද්ධකාලය තෙක් ඈතට දිවයන යන බව ත්‍රිපිටාකගත මූලාශ්‍රයන්ගෙන් මෙන්ම වංශකතා සාහිත්‍යයන්ගෙන් ද තොරතුරු හෙළිවන බව
- සැරියුත් මුගලන් අගසව් දෙනම මෙන්ම මහාප්‍රජාපතීගෝතමී ආදී ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධාතුතැන්පත්කොට බුදුරදුන් ස්තූප ඉදිකිරීමට බුදුරදුන් උපදෙස් ලබාදුන් බව වාර්ථාවේ.

- බුදුරදුන්ගෙන් දහම් අසා රහත්ඵලයට පත් බාහිය දාරුචීරිය එළදෙනෙක විසින් ඇන මරණයට පත්කරනු ලැබීමෙන් අනතුරුව එම දේහය ඇදක තබාගෙන ගොස් දවා ස්තූපයක් කරවන ලෙසට බුදුරදුන් උපදෙස් ලබා දුන් සඳහන් වේ.
- "චත්තාරෝ මේ ආනන්ද ථූපාරහා, කතමේ චත්තාරෝ ? තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝ ථූපාරහෝති. පච්චේක බුද්ධෝ ථූපාරහෝ තථාගතස්ස සාවකෝ ථූපාරහෝ රාජා චක්කවත්ති ථූපාරහෝති."යනුවෙන් ථූපාර්ය පුද්ලයන් පිළිබඳව මහාපරිනිබ්බාණ සූත්‍රයේ කරනු ලබන සඳහන තුළින්ද බෞද්ධ ස්තූපය පිළිබඳ සංකල්පය බුදුරදුන් විසින්ම ඉදිරිපත් කරන ලද්දක් බව පැහැදිළිවේ.
- බුදුරදුන් පිරිනිවන් පෑමට පෙර තථාගත දේහයට කෙසේ අවසන් ගෞරව දක්විය යුතුදැයි ආනන්ද තෙරුන් බුදුරදුන්ගෙන් විමසූවිට සක්විති රජකුගේ මෘතදේහයට අවසන් ගෞරව දක්වන ආකාරයට දේහය ආදාහනය කොට සිව්මන්සලක ස්තූපයක් ඉදිකර ප්‍රදක්ෂිණා කිරීමෙන්, මල්දම් පැලදවීමෙන්, සුවඳ හෝ සුනු ගැල්වීමෙන් එයට පූජා පැවත්වීමට උපදෙස් ලබාදීම තුළින්ද බෞද්ධ ස්තූපයේ ප්‍රභවය බුද්ධකාලය දක්වා ඈතට දිවයන බව පැහැදිළිය.
- බුද්ධ පරිනිර්වානයෙන් පසු ආදාහන කටයුතුවලට සම්බන්ධ ප්‍රදේශ අටක නියෝජිතයින්ට බුදුරදුන්ගේ ධාතු බෙදාදීමෙන් පසු ඔවුහු එම ධාතු නිදන්කොට ස්තූප තැනවූ  බව වාර්ථාවේ.
- පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ස්තූපයේ ආරම්භය ක්‍රි. පූ. තුන්වන සියවස දක්වා ඔබ්බට නොයන අතර අශෝක අධිරාජයා කළ සාංචි, භාර්හුට් ස්තූප තුළින් හෙළිවන බව

**විවිධ ස්තූප ආකෘති**

- ස්තූපයක බඳ කොටස හෙවත් ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප ආකෘති හයක් පැරණි ශ්‍රී ලාංකික කලා ශිල්පීන් හඳුන්වා දී ඇති බව

1. පද්මාකාර - පොළොන්නරුවේ දෙමළ මහා සෑය හා යුදඟණා ස්තූපය ආදිය
2. ඝණ්ටාකාර - අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය ආදි කුඩා ස්තූප රැසක් මේ ගණයට ඇතුළත් බව
3. ධාන්‍යාකාර - කැලණි ස්තූපය ආදිය
4. බුබ්බුලාකාර - රුවන්මැලි සෑය ඇතුළු මහා ස්තූප රැසක් මේ ගණයට ඇතුළත් බව
5. ඝටාකාර - කතරගම කිරිවෙහෙර, සෝමාවතී ස්තූපය මුලින් මේ හැඩයෙන් යුක්ත වූ බව
6. ආමලකාකාර - දැදිගම කොටවෙහෙරින් මේ වර්ගයේ ධාතු කරඬුවක් හමු වී ඇති බව

- මීට අමතර ව පසු කාලයේ පලාණ්ඩාකාර, අණ්ඩාකාර, චතුරාස්‍රාකාර, අෂ්ටාස්‍රාකාර ආදි
    - වශයෙන් තවත් ආකෘති කිහිපයක් පිළිබඳ ව තොරතුරු දැක්වෙන බව

7. i ථායිලන්ත ජන සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වී ඇති ආකාරය පරීක්ෂා කරන්න

සියලුම පිරිමින් තාවකාලිකව හෝ පැවැදිවී සිටිය යුතුවීම පැවැදිව සිටිබවට ලැබෙන සහතිකය විවාහයේදී හා රැකියාවේදී වැදගත්වීම

- දිනපතා උදෑසන පිණ්ඩපාතයේ වඩින භික්ෂූන් වහන්සේලා ලක්ෂ ගණනකට මහජනතාව ශ්‍රද්ධාවෙන් පිණ්ඩපාතය පිළිගැන්වීම
- බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත්වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දැරීම.
- ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානියා රජය විසින් පත්කරන ලද සංඝ රාජයන්වහන්සේ වීම
- ථායි ජනතාව දෛනිකව ආගමික කටයුතුවල නිරතවීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස්කරගෙන එම පූජාකටයුතුවල නිරවීම.
- මෙරට ලොකු කුඩා සෑම අයෙකුගේම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම සුලභ දර්ශනයක්වන අතර එය සකස්කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේවීම
- ථායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන්ම බහුල ව ළමයින්ද වාසය කිරිම
- වාර්ෂිකව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ වන අතර කඨින චීවරය රැගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විතවීම
- අධ්‍යාපනය කලාශිල්ප හා සාහිත්‍යයද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණයකරලීමට දායකවීම

ii අනුරාධපුර මහා විහාරයෙන් සිදු වූ ආගමික හා ජාතික මෙහෙවර අගයන්න.

ආගමික මෙහෙවර

- ලාංකේය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත්වීම
- ලාංකේය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය බවට මහාවිහාරය පත්වීම
- මහා අරිට්ඨ තෙරුන් වහන්සේ ඇතුළු මහ තෙරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ විනය සංගායනාව මහා විහාරය ආශ්‍රිතව සිදු කිරීම
- පාලි ත්‍රිපිටකයට සිංහල අට්ඨකතා මහා විහරයෙන් සැපයීම
- වලගම්බා හා මහසෙන් රාජ්‍ය වකවනුවලදීත් ඉන්පසුවත් ඇතැම් පාලකයන්ගේ කාල වකවානුවලදී ථෙරවාද බුදු සමයට අභියෝග එල්ල වූ අවස්ථාවන්හිදී ථෙරවාද බුදුසමය ආරක්‍ෂා කිරීමට දිවිහිමියෙන් කැපවීම
- මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඩ කිරීමට යොමුවීම
- බුද්ධඝෝෂ, බුද්ධ දත්ත හිමි, ධම්මපාල හිමි, පීතිමල්ල හිමි. විශාඛ හිමි වැනි ජාත්‍යන්තර පඬිවරුන් මහා විහාරය ඇසුරෙන් ථෙරවාද බුදු දහම හැදෑරීම
- කපාර පිරිවෙණ, කාල ප්‍රසාද පිරිවෙණ, සුන්හාත පිරිවෙණ, දික්සඳ සෙනවියා පිරිවෙන, ආදී ලක්දිව සිව් දිසාවේම මුල්කාලීනව බිහිවූ පිරිවෙණ මගින් ථෙරවාද බුදු දහම ප්‍රචලිත කිරීමට කටයුතු කිරීම
- දේශීය වශයෙන් පමනක් නොව පර්සියාව, ග්‍රීසිය, බුරුමය, චීනය වැනි රටවලින් ද ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින්ද පැමිණි භික්‍ෂූන් වහන්සේලාට සිල්ප හැදෑරීම ට අවස්ථාව ලබාදීම
- නා නා නිකායික මති මතාන්තර ඛණ්ඩනය කොට ථෙරවාදය සුරක්‍ෂිත කරගැනීමට කටයුතු කිරීම

ජාතික මෙහෙවර

- අනුශාසනා මගින් සමස්ත ජාතියේම අධ්‍යාමික වූත් බාහාර වූත් සංවර්ධනයට අදාළ උපදේශය ලබා දෙන නායකයන් ලෙස කටයුතු කිරීම.
- මහාවිහාරය හා තදානුබද්ධ විහාර ජාතියේ අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යාම. මෙහි දී ආධ්‍යාමික ශික්‍ෂණයට සමගාමීව ලෞකික දියුණුවට අදාළ විෂයයන් ද ජීවන දර්ශනය ද ඉගැන්වීම.
- මහා විහාරීය භික්‍ෂූන් පාලකයාගේ අනුශාසකයන් ලෙස කටයුතු කිරීමත්, ඇතැම් පාලකයන් තෝරා ගැනීමේ දීත්, ඇතැම් අධාර්මික පාලකයන් පලවා හැරීමේ දී ප්‍රමුඛ කාර්යය භාරයක් ඉටු කිරීම.
- අනාගත රාජ්‍යත්වය සඳහා පාලකයන් පුහුණු කොට රැක ගැනීම.
- ජාතික ව්‍යසනයන්හි දී ඉන් මිදීම සඳහා නායකත්වය හා නිසි උපදෙස් ලබා දීම.
- බුද්ධ දේශිත ශ්‍රී සද්ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන රැක ගනිමින් ද ග්‍රන්ථාරූඪ කිරීමෙන් ද අටුවා ග්‍රන්ථ හා වෙනත් විවිධ ග්‍රන්ථ රචනා කිරීමෙන් ද දේශිය ආගමික සංස්කෘතික අනන්‍යතාව සුරක්‍ෂිත කිරීමෙහි ලා ප්‍රමුඛත්වය ගැනීම.
- වෙදකම, ජ්‍යොතිෂය, ශාන්ති කර්ම වැනි පොදුජන ජීවිතයට සෘජු ව බද්ධ වූ සේවාවන් හි විශේෂඥයන් බවට පත් ව එමගින් ජාතික මෙහෙවරක් ඉටු කිරීම.

8. i බුදුසමය ඇසුරෙන් ගොඩ නැගුණු ශ්‍රී ලාංකේය සිරිත් විරිත් හා සාරධර්ම පුද්ගලයා හා සමාජය අතර බැඳීම් වර්ධනය කිරීමට හේතුවූ අයුරු පහදන්න.

• කළ යුතු දේ කරමින් යහපත් හැසිරීම්වල නිරත ව ගුණධර්ම පිරීම, ''සිරිත්'' වන බව හා වැරදි හැසිරීම්වලින් බැහැර ව නොකළ යුතු දේ වැලකීම විරිත් වන බව.

• ප්‍රාණඝාතයෙන් වැළකී සතුන්ට කරුණාව මෛත්‍රිය දැක්වීම, අදත්තාදානයෙන් වැළකී අන්සතු දේ ආරක්ෂා කිරීම, කාමමිථ්‍යාචාරයෙන් වැළකී ශිෂ්ට සම්මත අඹුසැමි සබඳතා පවත්වාගෙන යාම, මුසාවාදයෙන් වැළකී සත්‍ය වචන කථා කිරීම, මද්‍යසාර භාවිතයෙන් වැළකී සාමකාමී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට ශ්‍රී ලාංකිකයා යොමු වී ඇති බව

• දරු සම්පත් අපේක්ෂා කරන කාන්තාව තෙරුවන් වැඳ දෙවියන්ට පින් දී තමාට පින්වත් දරුවෝ ලැබෙත්වායි ප්‍රාර්ථනා කිරීමේ චිර චාරිත්‍රයක් ඇති බව

• නැකැත් තරු විචාරා සුදුසු කල් බලා පිළිසිඳ ගැනීම අපේක්ෂා කළ යුතු බව

• නිසි කල පැමිණි පසු සෙස්සන්ගේ අනුග්‍රහය ඇති ව ගැබ්පෙළහැර දැක්වීම හෙවත් නිසි රක්ෂාවරණය සැලසූ බව
• බුදු රජාණන් වහන්සේ වදාළ පරිදි අංගුලිමාල පිරිත දේශනා කරවාගෙන ආශීර්වාද ලබාගත් බව.
• උපන් දරුවා ප්‍රථමයෙන් දොරට වැඩීමේ චාරිත්‍රය හෙවත් විහාරස්ථානයට කැඳවාගෙන ගොස් බෝ සෙවණේ තබා පිරිත් සජ්ඣායනා කරවා ගන්නා බව
• නම් තැබීමේ දී දේශීය උෟරුවක් ඇති බෞද්ධ නමක් තැබීමට අදාළ නැකත් චරිත්‍රාදිය තෝරගත් බව
• නිසි කලට දරුවාගේ ආරක්ෂාව පිණිස පංචායුධය, ධර්ම චක්‍රය, බෝ පත්‍රය ආදි ආකෘති කර පැළඳවූ බව
• සුදුසු වයස එළඹි විට බෞද්ධ පුද සිරිත් පවත්වා දරුවාට ඉඳුල් කටගෑම සිදු කළ යුතු බව.
• නිසි කල පැමිණි පසු විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ හෝ වෙනත් පිළිගත් හා උගත් වැඩිහිටියකු හෝ ලවා බෞද්ධ චාරිත්‍රවලට අනුව අකුරු කියවීම කරන බව
• පවිත් වැළකීම හා යහපතෙහි යෙදවීම ආදී බෞද්ධ සිරිත්වලට දරුවා යොමු කළ බව
• ආවාහ විවාහ කටයුතුවල දී ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලබා ගන්නා බව
• ගෘහස්ථ ජීවිතයේ සියලු වැදගත් අවස්ථාවල දී ත්‍රිවිධ රත්නය මුල් කොටගෙන පුද සිරිත් පැවැත්වීම, දන් පැන් පූජා කිරීම, ධර්මයේ ආශීර්වාදය ලබා ගැනීම සිදු කරන බව
• අවමංගල්‍ය අවස්ථාවල දී බෞද්ධ චාරිත්‍ර ධර්මවලට අනුව භික්ෂූන් වහන්සේලා වැඩම කරවා මතකවස්ත්‍ර පූජා කිරීම, අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම ශ්‍රවණය කරවා පැන් වඩා පින් අනුමෝදන් කිරීම ආදි චාරිත්‍ර පවත්වන බව
• ප්‍රාප්ති, දානමය පින්කම් ලෙස සත්දින දානය තුන්මස් දානය හා වාර්ෂික දානය ආදිය වශයෙන් සන්ධිස්ථාන දිනවල පින්කම් පවත්වන බව
ශාසන මාමකත්වය, දන් දීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම , පරෝපකාරය, අවිහිංසාව, ගිලානෝපස්ථානය
• ''මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජසැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ය'' ආදි වශයෙන් දුටුගැමුණු රජතුමා ශාසන මාමකත්වයෙන් ක්‍රියා කර ඇති බවට උදාහරණ දැක්විය හැක.
• ලක්දිව රජවරුන් ඇතුළු ලක් වැසියන් භික්ෂූන් වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කිරීම, ආරාම ප්‍රතිසංස්කරණය කිරීම, කඨින චීවර පූජාව පැවැත්වීම, බෞද්ධ ආගමික උත්සව පැවැත්වීම ආදිය ශාසන මාමකත්වය නිසා සිදු කළ බව
• තමා සතු දේ පරිත්‍යාග කිරීම ''දානය'' වන බව හා ආමිසදානය, අභයදානය, ධර්මදානය පත්තිදාන ආදි වශයෙන් දානය විවිධ වන බව
• පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙන් දන් දීම සිදු කරන ලද බව
• සියලු දානයන්ගෙන් ධර්ම දානය උතුම් බව
• ආගන්තුක සත්කාරය සිංහල බෞද්ධ සංස්කෘතියේ වැදගත් සිරිතක් වශයෙන් සිදු කරන ලදබව
• දුර බැහැර නෑදෑයන් හෝ හිතවතුන් හෝ ගෙදරට පැමිණන විට ගෙහිමියා හෝ ගෘහිණිය හෝ පෙරමඟට ගොස් පිළිගැනීම සිදු කරන බව
• ආගන්තුක සත්කාරය සිදු කිරීමේ දී විවිධ ආචාර සමාචාර විධි පවත්වන බව
• සිංහල බෞද්ධ සිරිත්වලට අනුකුල ව ආගන්තුක සත්කාරය සිදු කරන බව
• වැඩිහිටියන්ට සැලකීමේ දී හුනස්නෙන් නැගිටීම, ඇඳිලි බැඳ කතා කිරීම, අභිවාදනය ආදිය සිදු කරන බව.
• වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිපැදීමට යොමුවන බව හා ඔවුන්ගේ කටයුතු ඉටුකරදීමට පෙලඹෙන බව
• පරෝපකාරය සඳහා යොමු වන්නන් සමාජයේ නිතර ප්‍රශංසාවට ලක් වන බව
• දුටුගැමුණු, විජයබාහු, පරාක්‍රමබාහු ආදි ප්‍රමුඛ පෙළේ රජවරුන් පවා ජීවිත පරිත්‍යාගයෙන් පරෝපකාරයේ යෙදුණු බව.
• මංමාවත් ඉදි කිරීම, ගිලන්හල් තැනීම, ආරෝග්‍යශාලා ඉදි කිරීම, ළිංපැන් පොකුණු තැනීම, දන්සැල් පැවැත්වීම, උයන්වතු වගාව, පාලම් හේ දඬු තැනීම, විශ්‍රාමශාලා තැනීම ආදිය පරෝපකාරිත්වයට අයත් වන සත්කාර්යයන් බව
• අත්තම් ක්‍රමය යටතේ ශ්‍රමය සාමූහික ව බෙදාගත් බව

• කුඩා සතකු වුව ද මැරීම බරපතළ වරදක් ලෙස සලකනවා පමණක් නොව, සතුන්ට හිරිහැර කිරීම, පීඩා කිරීම හා හිංසා කිරීම ද බරපතළ වරදක් ලෙස සලකමින් අවිහිංසා සහගතව ලක්වැසියන් හැසිරෙන බව.
• කෘෂිකර්මාන්තය සඳහා උපයෝගී කර ගන්නා ගවයින් වෙත පවා මහත් කරුණාවක් දක්වන බව
• ගිලනුන්ට උපස්ථාන කිරීම, බෞද්ධයකුගේ උසස් චාරිත්‍ර ධර්මයක් මෙන් ම එය උසස් සමාජ සේවයක් වන බව

ii මෙරට ජන කවියට මෙන්ම ගීත සාහිත්‍යය කෙරෙහිද බුදුදහමේ ආභාසය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පැහැදිලි
කරන්න.

- අපේ පැරණි සමාජය පන්සල ඇසුරෙන් හොඳ නරක කුසල් අකසල් පින් පව් හැඳින තම දෛණික ජීවන වෘත්තීන්හි නිරත වූ බව
- එම ජීවන වෘත්තීන්හිදී කාංසිය මහන්සිය දුක ශෝකය පීඩාව මගහරවා ගැනීමට ජනකවිය උපයෝගී කරගෙන ඇත.
- එම ජනකවියට බුදු දහම මූල බීජ වූ අවස්ථා පැල්කවි පතල් කවි පාරුකවි ගැල් කවී ආදිය පිළිබඳව විමසා බැලීමෙන් පැහැදිළි වේ.

• බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට, පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා, බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට, නිවන් පුරේ පලයන් තලගොයි පැටියා, සාදුකාර දී ඕරුවක නැගී වරෙන් යනුවෙන් සඳහන් ජනකවි මඟිනුත් තුන් සරණේ කවි මඟිනුත් බෞද්ධ ආභාසය පිළිබිඹු කෙරෙන බව
• තෙරුවන් පිළිබඳව ශ්‍රද්ධාව ජනනය කිරීමත් බුද්ධ චරිතය පිළිඹු කිරීමත් බෞද්ධ දර්ශනය ප්‍රකට කරලීමත්, ශාසන ඉතිහාසය, ඉදිරිපත් කිරීමත් අරමුණු කරගෙන මෙරට බෞද්ධ ගීත සාහිත්‍යය ගොඩනැගී ඇති බව

- ගීත සාහිත්‍යය කෙරෙහිද බුදුදහමේ ආභාසය ලැබී ඇති බවට අතීත මෙන්ම වර්තමාන ගීත සාහිත්‍ය නිදසුන් සපයයි.

• අමාදහර දිය ගලා ගලා, බුද්ධං සරණං ගච්ඡාමි, සුගත ලෝනා සම්බුද්ධ රාජා. දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධ, අඩවන් වූ දෙනෙතින් ගලනා, දස බිම්බර මාර සෙනඟ, පාරමිතාබල පූරිත පූජිත, සන්නාලියනේ, සංසාරේ බවේ දුකා, අඩු කුලේ කියාලා, කවාලා විළඳ ජාති, සොර දෙටුවෙක් කස තැළුම් කකා..... ආදි වශයෙන් ඇති ගීත නිදසුන් වශයෙන් දැක්විය හැකි බව.